
241811

# පුස්තකාල ප්‍රවෘත්ති
# நூலகச் செய்திகள் LIBRARY NEWS

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය
இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்
THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA

13 වන වෙළුම, 4 වන කලාපය / 1992 ඔක්තෝබර් - දෙසැම්බර්
மலர் 13 இதழ் 4 / அக்டோபர் - டிசம்பர் 1992
Vol: 13, No. 4 / 1992 October - December











පුස්තකාල සේවා මණ්ඩලයේ
අනුග්‍රහයෙන් පළවී
1992 රාජ්‍ය සාහිත්‍ය සම්මාන
ලද කෘති

## 1992 STATE LITERARY AWARD WINNING BOOKS

PUBLISHED WITH THE ASSISTANCE OF
SRI LANKA NATIONAL LIBRARY SERVICES BOARD

1992 ஆண்டிற்கான
சாகித்திய பரிசுபெற்ற,
தேசிய நூலக சேவைகள் சபையின்
அனுசரணையுடன் வெளியிடப்பட்ட நூல்கள்

පුස්තකාල විද්‍යා තැපැල් මාර්ගික පාඨමාලාවේ
ආරම්භක උත්සවය

தபால் மூலம் நூலக விஞ்ஞான பாட
நெறியின் ஆரம்ப விழா

Inauguration of the Library Science Postal Course -
1992.08.17






අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතියේ
සම්මන්ත්‍රණය


சர்வதேச தரப்படுத்தப்பட்ட நூல்
இலக்கமிடல் திட்டக் கருத்தரங்கு

Seminar on ISBN - 1992.07 30 / 31

පුස්තකාල සඳහා ලී බඩු පරිත්‍යාග කිරීම

நூலகங்களுக்கான தளபாட
அன்பளிப்பு

Donation of Library Furniture - 1992






CDS / ISIS තොරතුරු තාක්ෂණය පිළිබඳ නව දිල්ලියේ පැවැත්වූ
යුනෙස්කෝ කලාපීය වැඩමුළුව

CDS/ISIS தகவல் தொழில் நுட்பம் சம்பந்தமான கருத்தரங்கு, புது டில்லி

CDS / ISIS Seminar on Information Technology - New Delhi
1992.08.25 / 29

241811

# පුස්තකාල ප්‍රවෘත්ති
## நூலகச் செய்திகள் LIBRARY NEWS

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்

THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA

ආරම්භය ஆரம்பம் Established 1973

13 වන වෙළුම 4 වන කලාපය

1992 ඔක්තෝබර්-දෙසැම්බර්

සංස්කාරක උපදේශක මණ්ඩලය
ඊශ්වරී කොරයා
සභාපතිනි
එම්. එස්. යූ. අමරසිරි
අධ්‍යක්ෂ
නාලිනී ද සිල්වා
වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ
එච්. එම්. ගුණරත්න බණ්ඩා
සහකාර අධ්‍යක්ෂ
ජානකී ප්‍රනාන්දු
වැඩබලන සහකාර අධ්‍යක්ෂ
ප්‍රධාන සංස්කාරක
මිල්ටන් මලවි ආරච්චි
විශේෂ සංස්කාරක
ආර්. රාජනායගම්
සෝදුපත් කියවීම
යූරිකා පද්මිණී මුණසිංහ
කවර සැලසුම
කේ. එම්. අයි. ස්වර්ණසිංහ
ඡායාරූප
ප්‍රමිලා ධර්මරත්නම්
කවරය ඉදිරිපස ඡායාරූප
ප්‍රසන්න සෝමපාල
මුද්‍රණය
සීමාසහිත යුනයිටඩ් මර්චන්ට්ස්
කොළඹ 13.
බෙදාහැරීම
අලෙවි හා ප්‍රචාරණ අංශය
ප්‍රකාශනය
ප්‍රකාශන අංශය
සංවර්ධන හා පර්යේෂණ අංශය
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
නිදහස් මාවත කොළඹ 07 ශ්‍රී ලංකාව
දුරකථනය: 687583-698847
© ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය 1992
කලාපයක මිල රුපියල් 7.50
වසරක දායක මුදල රුපියල් 30.00
චෙක්පත් මුදල් හා තැපැල් ඇණවුම්පත්
සභාපති
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
නමට යොමු කරන්න.

மலர் 13 இதழ் 4

ஒக்டோபர் - டிசம்பர் 1992

பதிப்பாசிரியர் ஆலோசனைக் குழு
ஈஸ்வரி கொறயா
தலைவர்
எம்.எஸ்.யு. அமரசிறி
நெறியாளர்
நாளினி த சில்வா
பதில் பிரதி நெறியாளர்
எச்.எம். குணரத்ன பண்டா
உதவி நெறியாளர்
ஜானகி பெர்ணாண்டோ
பதில் உதவி நெறியாளர்
பிரதம பதிப்பாசிரியர்
மில்டன் மலவிஆரச்சி
விசேட பதிப்பாசிரியர்
ஆர். இராஜநாயகம்
அச்சு சரிபார்த்தல்
யூரிகா முனசிங்ஹ
மேலுறைச் சித்திரம்
கே.எம்.ஐ.ஸ்வர்ணசிங்ஹ
மேலுறை
பிரசன்னா சோமபால
புகைப்படப்பிடிப்பாளர்
பிரமிளா தர்மரட்ணம்
அச்சகத்தார்
யுனைட்டட் மேர்ச்சன்ஸ் லிமிட்டட்
கொழும்பு - 13
விநியோகிப்பாளர்
சந்தைப்படுத்தல், விளம்பரப்படுத்தற் பிரிவு
வெளியீடல்
வெளியீட்டுப் பிரிவு
அபிவிருத்தி ஆராய்ச்சிப் பிரிவு
ஸ்ரீலங்கா தேசிய நூலக சேவைகள் சபை
கொழும்பு - 7
ஸ்ரீ லங்கா
தொலைபேசி - 687583 - 698847
பெக்ஸ் 941 - 685 - 201
© ஸ்ரீலங்கா தேசிய நூலகம் 1992
பிரதியின் விலை ரூபா 7.50
ஆண்டுச் சந்தா ரூபா 30.00
சகல காசோலைகள், தபால் கட்டளைகள், காசுக் கட்டளைகளும் "தலைவர், ஸ்ரீலங்கா தேசிய நூலக சேவைகள் சபை" யின் பெயருக்கு எழுதப்பட வேண்டும்.

Volume 13 No. 4

October - December 1992

**Advisory Board of Editors**
Ishvari Corea
**Chairperson**
M. S. U. Amarasiri
**Director**
Nalini De Silva
**Deputy Director (Actg.)**
H. M. Gunaratne Banda
**Asst. Director**
Janaki Fernando
**Asst. Director (Actg.)**
**Editor in Chief**
Milton Malawiarachchi
**Special Editor**
R. Rajanayagam
**Proof Reading**
Urika Padmini Munasinghe
**Cover Design**
K. M. I. Swarnasinghe
**Photographer**
Pramila Tharmaratnam
**Cover**
Prasanna Somapala
Printers
United Merchants Ltd.
Colombo 13.
**Distributed by**
Sales Publicity Unit
**Published by**
Publications Unit
Research and Development Division
Sri Lanka National Library Services Board
Independence Avenue
Colombo 07.
Sri Lanka
Tel : 687583 - 698847
Fax : 941 - 685 - 201
© National Library of Sri Lanka 1992
Price per Copy Rs. 7.50
Annual Subscripttion Rs. 30/=
All cheques, Postal and Money orders should be forwarded to Chairman Sri Lanka National Library Services Board

# පටුන

පිටුව


| | |
|---|---|
| කතුවැකිය | 2 |
| පුවත් ලුහුඬින් | 3-4 |
| *செய்திகள்* | 5 |
| NEWS | 6 |
| ඩිවි දශම වර්ගීකරණය 20 වන සංස්කරණය හා කාලීනත්වය රැකගැනීම<br>පී. විදානපතිරණ | 7-10 |
| *நூலகங்களும் கணணியும்*<br>எம். பீ. எம். பைரூஸ் | 11 -15 |
| **Information for Development**<br>S. M. Kamaldeen | 16-17 |
| ජංගම පුස්තකාල සේවය<br>එම්. ඩී. එච්. ජයවර්ධන | 18-19 |
| ලේඛන කලාවේ ප්‍රභවය<br>ඒ. ලගමුව | 20-21 |
| **National Library of Sri Lanka Completes two years**<br>Upali Amarasiri | 22-24 |


## ගෙවී යන වසර

පුස්තකාල ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා පුස්තකාල හා තොරතුරු සේවා පවත්වාගෙන යාම අතින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ගෙවී යන වසර තුළ ඉටු කළ කාර්යභාරය විශාලය.

පුස්තකාල ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා වූ තොරතුරු පුස්තකාලවේදීන් හා පොදු පාඨකයා අතරට ගෙන යාමේ එක් මාධ්‍යයක් වූ "පුස්තකාල ප්‍රවෘත්ති" සඟරාව, වසර ආරම්භයේ සිට නව මුහුණුවරකින් හා කාලීනව පාඨකයා අතට පත් කිරීමට හැකිවීම අප ලද ජයග්‍රහණයන්ගෙන් එකකි.

නව පාලන ඒකකය වූ ප්‍රාදේශීය සභා මට්ටමින් පුස්තකාල කමිටු පිහිටුවීම කඩිනම් කිරීමත් එම කමිටුවල ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම හා ප්‍රාදේශීය පාලන ඒකක තුළ පුස්තකාල හා පුස්තකාලයාධිපතින්ගේ වැදගත්කම අදාළ බලධාරීන්ට ඒත්තු ගැන්වීමටත් අපි නිරන්තර උත්සාහයක යෙදුනෙමු.

පුස්තකාල සේවාව සංවර්ධනය කිරීම සහ කාර්යක්ෂම තොරතුරු සේවාවක් මහජනයාට ලබාදීමේ අරමුණින් ආරම්භ කළ "පුස්තකාල ප්‍රමිති" කිරීමේ කාර්ය මේ වසරේ දී වඩා වේගවත් කරන ලදී.

පොත් ප්‍රකාශන ආධාර වැඩ පිළිවෙල යටතේ මුද්‍රණය වූ ග්‍රන්ථ අතුරින් පහක් සඳහා රාජ්‍ය සාහිත්‍ය සම්මාන හිමිවීමත් තවත් ග්‍රන්ථ දහයක් ප්‍රශස්ත ගණයේ කෘතීන් සේ සැලකීමත් ප්‍රකාශන ක්ෂේත්‍රයේ පෝෂණය උදෙසා අපගේ දායකත්වය රාජ්‍ය මට්ටමින් අගය කිරීමක් බඳු වේ. පොත් ප්‍රකාශන ආධාර වැඩ පිළිවෙලෙහි මිනුම් දඬුවල නිරවද්‍යතාව විකල්ප සාහිත්‍ය උත්සව වලින්ද තවදුරටත් තහවුරු විය.

ගෙවී යන වසර තුළ අප ඉටු කළ කාර්යයන් අතුරින් කීපයක් පිළිබඳ මෙසේ සටහන් කරන අතර ලබන්නා වූ 1993 වසර පාඨක ඔබට සාමය හා සෞභාග්‍යය ප්‍රාර්ථනය කරන්නෙමු.

– සංස්කාරක –

1992 රාජ්‍ය සාහිත්‍ය උළෙලේ දී රාජ්‍ය සම්මාන හිමි වූ කෘතීන් 05ක් ම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය යටතේ පළවූ කෘතීන් වේ. මීට අමතරව මෙම ව්‍යාපෘතිය යටතේ පළවූ තවත් පොත් 10 ක් ප්‍රශස්ත ගණයේ කෘතීන් ලෙස එහිදී පිදුම් ලබා ඇත. මෙවර පුස්තකාල ප්‍රවෘත්ති සඟරාවේ පිට කවරය සැරසී ඇත්තේ එම ප්‍රකාශනවල පිට කවර වලිනි.

*1992 ஆண்டின் அரச சாகித்திய பரிசில் பெற்ற நூல்களில் 5 இலங்கைத் தேசிய நூலக சேவைகள் சபையின் நூல் உதவித் திட்டத்தின் கீழ் வெளியிடப்பட்டவையாகும். மேலும் இத்திட்டத்தின் கீழ் வெளியிடப்பட்ட 10 நூல்கள் விசேட தகுதிப் பரிசில்களைப் பெற்றன. இவ்விதழின் அட்டைப் படத்தில் சாகித்திய பரிசு பெற்ற வெளியீடுகளின் மேலுறைகள் சித்தரிக்கப்பட்டுள்ளன.*

Five publications which were published under the Publication Asssistance Project of the Sri Lanka National Library Services Board received State Literary Awards at the 1992 State Literary Awards ceremony. Another 10 titles of the project received special Merit Awards. The cover of this issue is illustrated with the jackets of the award winning publications.

# පුවත් ලුහුඬින්

## ප්‍රාදේශීය සභා පුස්තකාල කමිටු

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ මෙහෙයවීමෙන් දිවයින පුරා පිහිටුවා ඇති ප්‍රාදේශීය සභා පුස්තකාල කමිටු සාර්ථකව ක්‍රියාත්මක වන බව මෑතකදී කරන ලද සමීක්ෂණයකින් හෙළිවී ඇත. ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන්ගේ ප්‍රධානත්වයෙන් ඇති මෙම කමිටුව විසින් අදාළ ප්‍රදේශයේ පුස්තකාල කටයුතු විධිමත් ලෙස සංවිධානය කිරීම සඳහා පියවර රාශියක් දැනටමත් ගෙන ඇත. මේ යටතේ ප්‍රදේශයේ පාසැල් පුස්තකාල හා මහජන පුස්තකාල සේවාවන් සම්බන්ධීකරණය කරලීමට විශේෂ ප්‍රයත්නයක් ගැනේ. ඒ අනුව දැනටමත් දිවයිනේ ප්‍රදේශ ගණනාවක මහජන පුස්තකාල හා පාසැල් පුස්තකාල හොඳ සම්බන්ධතාවයක් ගොඩනගා ඇති බව පෙනී ගොස් ඇත. මේ යටතේ පුස්තකාල අතර පොත්පත් හුවමාරු කර ගැනීම, එක් පුස්තකාලයකින් තවත් පුස්තකාලයකට වෘත්තීය උපදෙස් ලබාදීම, පොදු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම විශේෂයෙන් සිදුවේ. මෙම පුස්තකාල කමිටු වලට සම්බන්ධව පිහිටුවා ඇති විශේෂ අනු කමිටු මගින් ප්‍රදේශයේ පුස්තකාල සඳහා පොත්පත් තේරීම, විශේෂ තොරතුරු අවශ්‍යතා හඳුනාගෙන තොරතුරු ප්‍රචාරණය ආදිය සිදු කෙරේ.

## ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය වර්ෂ 08 ක් සම්පූර්ණ කර ඇත. ලංකාවේ මෙතෙක් රාජ්‍ය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වූ විශාලතම ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය වන මේ මගින් දැනටමත් අළුත් පොත් 800 ක් පමණ ප්‍රමාණයක් පළ කිරීමට කතෘන්ට ආධාර කර ඇත. මේ යටතේ ප්‍රකාශයට පත්වූ පිටපත් සංඛ්‍යාව දස ලක්ෂ තුනහමාරක් පමණ වේ. මෙම ව්‍යාපෘතිය නිසා අළුතින් බිහිවූ ග්‍රන්ථ කතෘන් සිය ගණනකි. ග්‍රන්ථ ප්‍රකාශනය, නිර්මාණය හා මුද්‍රණය පිළිබඳ ව්‍යාපෘතියේ ඇති ප්‍රමිතීන් නිසා ප්‍රකාශනවල උසස් තත්වයක් ඇති වීමට එය බලපා තිබේ. පසුගිය සත් වසර තුළ රාජ්‍ය සාහිත්‍ය සම්මාන දිනූ පොත් වලින් බහුතරයක් මණ්ඩලයේ ප්‍රකාශන ආධාර ව්‍යාපෘතියේ අනුග්‍රහයෙන් පළවූ ඒවා වේ. මේ වසරේ සම්මාන දිනූ කෘතීන් 22 න් 16 ක්ම මෙම ව්‍යාපෘතියේ ප්‍රකාශන වේ. මෙම ව්‍යාපෘතිය මගින් පළවන පොත් වලින් විශාල ප්‍රමාණයක් දිවයිනේ පුස්තකාල් අතර නොමිලේ සහ සහන මිළට පුස්තකාල සේවා මණ්ඩලය මගින් බෙදා හරිනු ලැබේ. ඒ අනුව මේ මගින් දිවයිනේ පුස්තකාල සේවාවට ලැබී ඇති රුකුල ද ඉතා විශාලය.

## "මත්ද්‍රව්‍ය දුරලමු-පොත්පත් කියවමු"

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විසින් දෙවන වරට ද "මත්ද්‍රව්‍ය දුරලමු-පොත්පත් කියවමු" තේමාව යටතේ ඉතා සාර්ථක සම්මන්ත්‍රණයක් හා ප්‍රදර්ශනයක් 1992.09.25-1992.09.29 කාලය තුළදී පවත්වන ලදී. මෙම එක්දින සම්මන්ත්‍රණයට පාසැල් ශිෂ්‍යයින් විශාල ප්‍රමාණයක් සහභාගි වූහ. දින 05 ක් තිස්සේ පැවති ප්‍රදර්ශනය විශාල ජනතාවක් විසින් නරඹන ලදී.

බම්බලපිටිය සිංහ සමාජය සහ ශ්‍රී ලංකා මත්ද්‍රව්‍ය විරෝධී සංගමය මෙය සංවිධානය කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට සහාය විය. කියවීමේ රුචිකත්වය වර්ධනය කිරීම යන මැයෙන් මණ්ඩලයේ වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂිකා නාලිනී ද සිල්වා මහත්මිය විසින් දේශනයක් පවත්වන ලදී.

## ප්‍රාදේශීය සම්මන්ත්‍රණයක්

රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා සභාපතිවරුන් හා පුස්තකාලයාධිපතීන් සඳහා සම්මන්ත්‍රණයක් 92.09.24, 25 යන දිනවල රත්නපුර ප්‍රාදේශීය පළාත් සභා අමාත්‍යාංශ කාර්යාලයේදී පැවැත්විණි. සබරගමුව පළාතේ පළාත් පාලන හා සුභසාධන ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සමුළුවට පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ, ක්‍රියාකාරී අධ්‍යක්ෂ, පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්, පළාත් පාලන කොමසාරිස් ඇතුළු නිලධාරීන් රාශියක් ද සහභාගි වූහ. රත්නපුර දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාලවල ගැටළු පිළිබඳව මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා විය. දැනට සබරගමුව පළාතේ මහජන පුස්තකාල සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල් ප්‍රමාණය ලබන වසරේ දෙගුණයක් කිරීමට ගරු ඇමතිතුමා අදාළ නිළධාරීන්ට මෙහිදී උපදෙස් දෙන ලදී.

## පුස්තකාල විද්‍යා තැපැල් මාර්ගික පාඨමාලාව

වෘත්තීය පුහුණුවක් නොමැතිව දිවයිනේ දුරස්ථ ප්‍රදේශයන්හි සේවය කරන පුස්තකාල සේවකයින්ගේ වෘත්තීය අවශ්‍යතාවයන් සපුරාලීමේ අරමුණින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය අරඹා ඇති පුස්තකාල විද්‍යා ප්‍රලේඛන හා විඥාපන විද්‍යා තැපැල් මාර්ගික පාඨමාලාවේ 1992/93 අදියරේ සහ පසුගිය වර්ෂ වල පාඨමාලාලාභීන්ට සහතික පත්‍ර ප්‍රදානය සහ 1992/93 පාඨමාලාවේ ආරම්භක උත්සවය 1992 අගෝස්තු 17 වෙනි දින ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ශ්‍රවණාගාරයේදී ගරු අධ්‍යාපන සේවා අමාත්‍ය සුනේත්‍රා රණසිංහ මැතිණියගේ ප්‍රධානත්වයෙන් පත්වන ලදී.

## නව ප්‍රකාශන

ISBN ප්‍රකාශන නාමාවලියෙහි නව සංස්කරණයක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ISBN අංශයෙන් ප්‍රකාශයට පත්කර ඇත. ISBN ව්‍යාපෘතියෙහි ලියාපදිංචි ප්‍රකාශකයින් සඳහා රුපියල් 100/- කටද, සාමාන්‍ය පාඨකයා සඳහා රුපියල් 200/- කටද මෙම නාමාවලියෙහි සීමිත පිටපත් සංඛ්‍යාවක් අලෙවිය සඳහා ඇත.

## විදේශ චාරිකා

1992 අගෝස්තු 25 සිට 29 දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති සමාජ විද්‍යාව පිළිබඳ ආසියානු පැසිපික් තොරතුරු පද්ධතියෙහි කලාපීය උපදේශක කමිටුවේ තෙවෙනි රැස්වීම සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පාඨක සේවා හා ප්‍රතිග්‍රහණ අංශයේ සහකාර අධ්‍යක්ෂිකා ජානකී ප්‍රනාන්දු මෙනවිය සහභාගි විය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපතිනි ඊශ්වරී කොරයා මහත්මිය සහ සහකාර අධ්‍යක්ෂ එච්. එම්. ගුණරත්න බණ්ඩා මහතා ඉන්දියාවේ පැවති අන්තර් ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ 58 වැනි වාර්ෂික සමුළුවට සහභාගි වූහ. මෙම සමුළුව 1992 අගෝස්තු 30 සිට 1992 සැප්තැම්බර් 5 දක්වා පවත්වන ලදී.

## අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය ISBN දෙදින සම්මන්ත්‍රණය හා ප්‍රදර්ශනය

අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සිව්වැනි අදියර වශයෙන් 1989 න් පසු ව්‍යාපෘතියට එක්වූ වාණිජ, රජයේ සහ රාජ්‍ය නොවන ආයතනික සහ පෞද්ගලික / කතෘ ප්‍රකාශකයින් සඳහා දෙදින සම්මන්ත්‍රණයක් සහ ප්‍රදර්ශණයක් 1992 ජුලි 30 සහ 31 දිනයන්හි ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේදී පවත්වන ලදී. පළමු දින වාණිජ මට්ටමේ ප්‍රකාශකයින් සහ රජයේ සහ රජයේ නොවන ප්‍රකාශකයින් සඳහාත් දෙවන දින පෞද්ගලික / කතෘ ප්‍රකාශකයන් සඳහාත් සම්මන්ත්‍රණය පැවැත්විණි.

අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමයේ ශ්‍රී ලංකා නියෝජිතයා ලෙස ක්‍රියා කරන ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මෙම සම්මන්ත්‍රණය සහ ව්‍යාපෘතියේ ප්‍රගතිය විදහා දක්වන ප්‍රදර්ශනයක්ද පවත්වන ලදී.

## හොඳම පුස්තකාල කමිටුව තේරේ

දිස්ත්‍රික් මට්ටමින් හොඳම පුස්තකාල කමිටුව තේරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ආරම්භ කර ඇත. සෑම දිස්ත්‍රික්කයකම ඇති ප්‍රාදේශීය සභා පුස්තකාල කමිටු, මහනගර සභා පුස්තකාල කමිටු සහ නගර සභා පුස්තකාල කමිටු අතරින් හොඳම පුස්තකාල කමිටු 03 තෝරා ගැනේ. මෙහිදී පුස්තකාල කමිටුවල ක්‍රියාකාරිත්වය, ඒ මගින් ඉටු කෙරෙන කටයුතු, අනු කමිටු ක්‍රියාත්මක වීම වැනි දෑ සළකා බැලේ. ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථානවලට පැමිණෙන පුස්තකාල කමිටුවල සභාපතිවරුන්ට හා ලේකම්වරුන්ට විශේෂ සහතික පත්‍ර සහ සංකේත ද, එම පුස්තකාල කමිටුවට සම්බන්ධ පුස්තකාල වෙත පොත් පරිත්‍යාග කිරීම ද මණ්ඩලය මගින් සිදු කෙරේ.

## විදේශීය අමුත්තන්

එක්සත් රාජධානියේ ලප්බරා සරසවියේ පුස්තකාලයාධිපති මහාචාර්ය ඇන්තනි ජේ. එවන්ස් මහතා සැප්තැම්බර් මස පළමු සතියේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට පැමිණෙන ලදී. එහිදී විශ්ව විද්‍යාල පුස්තකාල යන මැයෙන් ජාතික පුස්තකාල දේශන මාලා වේ සැප්තැම්බර් මස දේශනය එවන්ස් මහතා විසින් පවත්වන ලදී.

ඇමෙරිකා එක්සත් ජනපදයේ කොලරාඩෝ විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා අංශයේ මහාචාර්ය වර්ජිනියා බවුවර් මහත්මිය ද සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට පැමිණෙන ලදී. ඒ මහත්මිය ඉෆ්ලා සංවිධානයේ අන්තර් පුස්තකාල පිරුළු සේවා පිළිබඳ කමිටුවේ සභාපතිවරියද වේ. ශ්‍රී ලංකාවේ අන්තර් පුස්තකාල පිරුළු සේවා ක්‍රමයක් හඳුන්වාදීම පිළිබඳව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සමග සාකච්ඡාවක් ඒ මහත්මිය විසින් පවත්වන ලදී.

## මධ්‍යම පළාතේ පුස්තකාල සංවර්ධන කටයුතු

මධ්‍යම පළාත් සභා ප්‍රදේශයේ පුස්තකාල සංවර්ධන කටයුතු පිළිබඳව සාකච්ඡාවක් 92.11.10 වන දින මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යාලයේ දී පැවැත්විණි. මධ්‍යම පළාත් සභාව වෙනුවෙන් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් පාලිත ඇල්කඩුව මහතා, මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස් ආනන්ද වීරසේන මහතා, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ එන්. පිලපිටිය මහත්මිය, මහනුවර ඩී. එස්. සේනානායක අනුස්මරණ පුස්තකාලයේ පුස්තකාලයාධිපති ඩී. රත්නායක මහත්මිය, පුස්තකාල සේවා මණ්ඩලය වෙනුවෙන් සභාපති ඊශ්වරී කොරයා මහත්මිය, අධ්‍යක්ෂ එම්. එස්. යූ. අමරසිරි මහතා සහකාර අධ්‍යක්ෂ එච්. එම්. ගුණරත්න බණ්ඩා මහතා සහභාගි වූහ. මධ්‍යම පළාතේ පුස්තකාල සංවර්ධන කටයුතු සඳහා පහත දැක්වෙන වැඩපිළිවෙල ක්‍රියාත්මක කරලීමට එම සාකච්ඡාවේ දී තීරණය විය.

* මැතක දී බඳවා ගැනීමට නියමිත ගුරුවරුන් අතුරින් ගුරුවරුන් 300 ක් පමණ පළාතේ ප්‍රධාන ද්විතීය පාසැල්වලට ගුරු පුස්තකාලයාධිපතීන් ලෙස පත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා එකඟ විය. මෙම ගුරුවරුන්ගේ ප්‍රධාන රාජකාරිය විදුහලේ පුස්තකාලය මනාව පවත්වා ගෙන යාම වේ. කෙටිකාලීන පාඨමාලා මගින් මේ ගුරුවරුන් සඳහා පුස්තකාල විද්‍යා පුහුණුවක් ලබාදීම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් ඉටු කෙරේ.

* පළාතේ පාසැල් හා මහජන පුස්තකාල අතර සබඳතාවය වැඩි දියුණු කිරීමට විශේෂ පියවර ගැනීමට තීරණය විය. පාසැල් හා මහජන පුස්තකාල අතර පොත්පත් හුවමාරු කර ගැනීම, පාසැල් පුස්තකාල සංවිධානය කර ගැනීම සඳහා මහජන පුස්තකාලයාධිපතිවරුන්ගේ සහාය ලබා ගැනීම, පොත්පත් මිළදී ගැනීමේ දී එකතු වී කටයුතු කිරීම ආදී සාමූහික කටයුතු විධිමත් කිරීම සඳහා අදාළ උපදෙස් සහිතව විශේෂ චක්‍රලේඛයක් නිකුත් කිරීම.

* පුස්තකාල පහසුකම් නොමැති කුඩා පාසැල් සඳහා පුස්තකාල පොත් අල්මාරි ව්‍යාපෘතියක් මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය වෘත්තීය උපදෙස් සහ පොත් ආධාර ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් සැපයේ.

* මධ්‍යම පළාතේ සෑම ප්‍රාදේශීය සභාවකම පුස්තකාල උපදේශක කමිටු පිහිටුවා ඇති අතර මෙම කමිටුවල ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කරලීමටත්, එම කමිටුවල කටයුතු සඳහා හැකි සෑම ආධාරයක්ම ලබා දීමටත් තීරණය විය.

## රාජ්‍ය සාහිත්‍ය සම්මාන

1991 වර්ෂයේ ප්‍රකාශිත ග්‍රන්ථවලින් රාජ්‍ය සාහිත්‍ය සම්මාන හිමිකරගත් ග්‍රන්ථ සඳහා සම්මාන පිරිනැමීම සැප්තැම්බර් 27 දා ගිරාඳුරුකෝට්ටේදී සිදුවිය.

විවිධ විෂය ක්ෂේත්‍රවලින් ග්‍රන්ථ 29 ක් මෙම සම්මාන සඳහා නම් කෙරුනු අතර, ඉන් ග්‍රන්ථ 15 ක්ම පොත් ප්‍රකාශන ආධාර වැඩ පිළිවෙළේ අනුග්‍රහයෙන් ප්‍රකාශයට පත්වූ ග්‍රන්ථ වේ. රාජ්‍ය සාහිත්‍ය සම්මාන දිනූ එම ග්‍රන්ථ 15 කතෘවරුන්ගේ නම් සහ ග්‍රන්ථනාම මෙසේයි.

### රාජ්‍ය සම්මාන ලැබූ කෘතීන්

හොඳම කෙටිකතාව - ආචාර්ය සෝමරත්න බාලසූරිය කරත්තය
හොඳම විවිධ විෂය - පියසේන කහඳගමගේ කෙතක මහිම – කමත
කෘති - මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ ස්තූප
- ඇන්. ටී. කරුණාතිලක
බේම් ගහ බඩ චිත්ති
හොඳම පරිවර්තන – චින්තා ලක්ෂ්මී සිංහාරච්චි අපූගේ ලෝකය
කෘතිය

### ප්‍රශස්ත ගණයේ කෘතීන්

| | | |
|---|---|---|
| කාව්‍ය | දයාසේන ගුණසිංහ | දොරමඩලාව |
| | ආරියවංශ රණවීර | සඳ ඇබින්දක් |
| නවකතා | ජයතිලක කම්මැල්ලවීර | නාත්තලාගේ කතාව |
| කෙටිකතා | එරික් ඉලයප්ආරච්චි | වඩදිය |
| | පියසීලි විජේමාන්න | සහෘදයෝ |
| විවිධ විෂය | මහාචාර්ය තිස්ස කාරියවසම් | ගම්මඩු පුරාණය |
| | විජයසිරි වෙත්තමුනි | දේශයට ජීවය දුන් පනස්වෙනි දශකයේ කවි සහරා |
| | මහාචාර්ය සුනිල් ආරියරත්න | දෙමළ සාහිත්‍ය ඉතිහාසය |
| පරිවර්තන | කුලසේන පොන්සේකා | අන්තිම දුම්රිය |
| | ජී. නාරාවිල පැට්‍රික් | නොරදන අමාදිය |

# செய்திகள்

## சமூகவிஞ்ஞானங்களுக்கான ஆசிய-பசுபிக் தகவல் வலையமைப்பின் (APINESS) மூன்றாவது பிராந்திய ஆலோசனைக் கூட்டமும் (APINESS/RAG III)

## CDS/ISIS தகவல் தொழினுட்பவியல் சம்பந்தமான பிராந்திய பயிற்சிக் கருத்தரங்கும் செய்முறையும்

சமூக விஞ்ஞானங்களுக்கான ஆசிய-பசுபிக் தகவல் வலையமைப்பின் மூன்றாவது பிராந்திய ஆலோசனைக் கூட்டம்(APINESS/RAG 711), UNESCO வின் பிராந்திய, ஆசிய பசுபிக், சமூக மனிதவியல் பிரிவினால்(RUSHAP) ஒழுங்குபடுத்தப்பட்டது. இந்திய சமூக விஞ்ஞான ஆராய்ச்சிக் கவுன்சிலின் அனுசரணையுடன் மேற்குறிப்பிட்ட இக்கூட்டமானது, புது டில்லியிலுள்ள அசோக் ஹோட்டலில், 1992ஆம் ஆண்டு, ஒகஸ்ட் மாதம் 25ம் திகதி தொடக்கம் 29ம் திகதி வரை நடைபெற்றது.

APINESS தேசிய தொடர்பு நிலையங்களிலிருந்து 13 பிரதிநிதிகளும், சமூக விஞ்ஞானத் துறையில் ஏற்கனவே நிறுவப்பட்டுள்ள வலையமைப்புகளிலிருந்தும், பிராந்திய, சர்வதேச நிறுவனங்களிலிருந்தும் 21 பிரதிநிதிகளும் இக்கூட்டத்துக்குச் சமூகமளித்திருந்தனர். இலங்கையின் பிரதிநிதியாக இலங்கைத் தேசிய நூலகத்தில் பதில் உதவி நெறியாளராகக் கடமையாற்றும் செல்வி. ஜானகி பெர்னாண்டோ பங்குபற்றினார்.

"இலங்கையில் சமூக விஞ்ஞானத் துறையில், ஆவணவாக்கல், தகவல் சேவைகளின் முன்னேற்றம் (இரண்டாவது பிராந்திய ஆலோசனைக் கூட்டத்திலிருந்து)", என்ற தலைப்பில் அவர் ஒரு தேசிய அறிக்கையைச் சமர்ப்பித்தார்.

தேசிய, பிராந்திய மட்டங்களில் இதுவரை காலமும் APINESS இன் செய்முறை, எதிர்காலத்தில் APINESS ஐ ஊக்குவித்து முன்னேற்றுவதற்கான வழிமுறைகள்,ஒழுங்குகள் போன்ற விடயங்கள் இக்கூட்டத்தில் கலந்தாலோசிக்கப்பட்டது. CDS/ISISதகவல் தொழினுட்பவியல் சம்பந்தமான ஒரு பிராந்திய கருத்தரங்கும் புதுடில்லியிலுள்ள விஞ்ஞான தொழினுட்பவியலுக்கான தேசிய தகவல் நிலையத்தில் நடைபெற்றது. கொம்பியூட்டர் (கணணிப்) பாவனையில் பங்குபற்றியோரின் வேலைத்திறனை விருத்தியாக்குவது போன்ற இன்னோரன்ன நோக்கங்களுக்காக இப் பயிற்சிக் கருத்தரங்கு ஒழுங்கு செய்யப்பட்டது.

## றோயல் கல்லூரியில் நூலக வாரம்

கொழும்பு றோயல் கல்லூரி 1992.09.02 தொடக்கம் 1992.09.08 வரை நூலக வாரமாகப் பிரகடனப்படுத்தியுள்ளது. இதன் முக்கிய நோக்கம் நூலகத்தை விருத்தியாக்குவதும், மாணவர்களிடையே நூலக பாவனை, புத்தக வாசிப்பு என்பனவற்றை அறிமுகப்படுத்தி, ஊக்குவித்தல் என்பனவாகும். தேசிய நூலகத்தின் நெறியாளர் திரு.உபாலி அமரசிரி அவர்கள் 1992.09.02 ஆம் திகதி நூலக வாரத்தை ஆரம்பித்து வைத்து விசேட உரையாற்றினார்.

## சிறந்த நூலகக் குழுவைத் தெரிவுசெய்தல்

மாவட்ட ரீதியில் சிறந்த நூலகக் குழுவைத் தெரிவு செய்யும் பணியை இலங்கைத் தேசிய நூலக சேவைகள் சபை ஆரம்பித்துள்ளது. இதன் மூலம், இலங்கையின் சகல மாவட்டங்களிலுமுள்ள பிராதேசிய சபை நூலகக் குழுக்கள், மாநகர சபை நூலகக் குழுக்கள், நகர சபை நூலகக் குழுக்களிடையே சிறந்த மூன்று குழுக்கள் தெரிவுசெய்யப்படும். சிறந்த குழுக்களைத் தெரிவு செய்யும்போது, குழுக்களின் செயற்றிறன், இதுவரை காலமும் நடாத்தி வந்த செயற்பாடுகள் போன்றவை கருத்திற் கொள்ளப்பட்டுத் தெரிவு செய்யப்படும். முதலாம், இரண்டாம், மூன்றாம் இடங்களை எடுக்கும் நூலகக் குழுத் தலைவர்களுக்கும் செயலாளர்களுக்கும் ஒரு விசேட சான்றிதழ் வழங்குவதுடன், அக்குழுக்களுடன் சம்பந்தப்பட்ட நூலகங்களுக்கும் சபையினால் நூல் அன்பளிப்புச் செய்யப்படும்.

## வெளிநாட்டு விருந்தினர்

ஐக்கிய இராச்சியத்திலுள்ள லவ்பரா பல்கலைக் கழகத்தின் நூலகர் பேராசிரியர் E.J. எவன்ஸ் செப்டம்பர் மாதம் இலங்கைத் தேசிய நூலகத்துக்கு வருகை தந்தார். தேசிய நூலகத்தின் மாதாந்த கருத்தரங்குத் தொடரின் செப்டம்பர் மாதத்திற்குரிய கருத்தரங்கு, "பல்கலைக் கழக நூலகங்கள்" என்ற தலைப்பில் இவரால் நடாத்தப்பட்டது.

அமெரிக்க ஐக்கிய நாடுகளின் கொலராடோ பல்கலைக்கழகத்தில் நூலக விஞ்ஞானப் பிரிவின் பேராசிரியர் திருமதி. வேர்ஜீனியா பவுஜர் இலங்கைத் தேசிய நூலகத்துக்கு செப்டம்பர் மாதம் வருகை தந்தார். இவர் இப்ளா அமைப்பின், "நூலகங்களுக்கிடையிலான இரவல்" பிரிவின் தலைவியுமாவார். இலங்கைத் தேசிய நூலகத்தின் சிரேஷ்ட உத்தியோகத்தர்கள் மத்தியில் இவர் "நூலகங்களுக்கிடையிலான இரவல் முறை" பற்றிக் கலந்துரையாடினார்.

# NEWS

## APINESS / RAG III

The third meeting of the Regional Advisory Group of the Asia Pacific Information Network in Social Sciences (APINESS / RAG III) was organized by the UNESCO Regional Unit for Social and Human Sciences in Asia and the Pacific (RUSHSAP) and hosted by the Indian Council of Social Science Research (ICSSR). This meeting was held at the Ashok Hotel, New Delhi, India, 25th - 29 th August, 1992.

Thirteen representatives of the APINESS National Contact Points and 21 representatives of Regional and International Organizations and already existing regional information networks in Social Sciences attended the meeting. Miss. Janaki Fernando, Acting Assistant Director, National Library represented Sri Lanka at this meeting and presented a Country Report titled - "New Developments of Documentation and Information Services in the Social Sciences in Sri Lanka (since RAG II)"

The objectives of the meeting were to :

(i) Review the activities of the APINESS both at National and Regional Levels ;
(ii) Discuss the ways and means to strengthen and promote APINESS nationally as well as regionally;
(iii) Consider and discuss the special requests submitted by countries in the region (Cambodia, Laos, Peoples Republic of China) and
(iv) Consider the future programme of APINESS and to give suggestions for UNESCO's future programme and activities in the field of information and documentation services and networking, particularly in connection with the New Mobilizing Project on YOUTH SHAPING THE FUTURE.

A Regional Training Seminar and workshop on the use of CDS / ISIS and Information Technology was held at the National Information System for Science and Technology, Department of Scientific and Industrial Research, Technology Bhawan, New Delhi, India. This training seminar/workshop have been organized to improve the skills of the participants, in the fields of computer application, storage and retrieval of Social Science Information and creation of bibliographical data bases by using CDS / ISIS software.

## FUTURE DIMENSIONS AND LIBRARY DEVELOPMENT IN SOUTH ASIA

The 9th Congress of South Asian Librarians will be held in Bangkok on May 2-7. 1993 under the theme of future dimensions and library development. The scientific programme will include papers related to all aspects of Library and Information Sciences, technology of present and future development of Libraries and information centres.

## CONFERENCE OF DIRECTORS OF NATIONAL LIBRARIES OF ASIA AND OCEANIA

The 5th Conference of Directors of National Libraries of Asia and Oceania was held in Kuala Lumpur, Malaysia from Nov. 23-26, 1992.

## MALAYSIAN TECHNICAL COOPERATION PROGRAMME

This programme was launched by the Malaysian Government in 1980 to promote and facilitate technical cooperation amongst developing countries based on the concept of self - reliance. The Programme encourages the exchange of relevant experiece, pooling and sharing of resources and the development of complementary capabilities. The National Library of Malayasia has been involved in this programme since 1985. Two courses are being offered.

(a) **Basic Course for Library Assistants**
This course is designed to equip non-professional staff in libraries with the necessary skills and knowledge in order to assist, and when necessary to run/maintain the library.

(b) **Library Visits / Attachments**
This course is designed to provide professional staff in libraries with a general overview of library systems, practices and procedures in relation to the organization and management of different types of libraries in Malaysia.

A total of 89 participants from 28 countries have benefited from this Programme. The countries involved thus far are Zimbabwe, Malawi, Oman, Zambia, Botswana, Sudan, Sri Lanka, Seychelles, Kiribati, Maldives, Indonesia, Brunei Darussalam, Thailand, Philippines, Singapore, Tonga, Fiji, Solomon Islands, Papua New Guinea, South Africa and Myanmar.

## LIBRARY GRADING

The following libraries have been upgraded by the Sri Lanka National Library Services Board recently.

| | |
|---|---|
| * Library, Deparment of Censes and Satistics | - Grade I |
| * Library, Ministry of Sports | - Grade II |
| * Library, Law Commission of Sri Lanka | - Grade II |
| * Library, Building Research Organization | - Grade II |

## A LIBRARIAN AS VICE CHANCELLOR

**Mr. W. B. Dorakumbura**, Librarian, University of Sri Jayawardenapura has been appointed as the new Vice Chancellor of the same University. This is the first occasion in Sri Lanka a Librarian has been appointed to this prestigious position. The Sri Lanka National Library Services Board on behalf of all library personnel in Sri Lanka Congratulates Mr. Dorakumbura on this historic occasion.

## CDS / ISIS Use in Sri Lanka

Mr. N. U. Yapa, Director of Information IMMI presented a paper on the use of Micro CDS/ ISIS in Sri Lanka at the Asian Regional Meeting of Trainers and Distributors of CDS / ISIS software Packages, Quezn City. Philippines 5 - 9 oct. 1992.

# ඩිවි දශම වර්ගීකරණය 20 වන සංස්කරණය හා කාලීනත්වය රැක ගැනීම

පී. විදානපතිරණ

ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## හැඳින්වීම

මෙල්විල් ඩිවි විසින් ඇමෙරිකාවේ ඇම්හර්ස්ට් (Amherst) විද්‍යාලයෙහි පුස්තකාල සේවයෙහි නියුක්තව සිටිය දී එවකට ප්‍රකටව තිබූ අරාබි ඉලක්කම් ක්‍රමය උපයෝගී කර ගනිමින් තත්කාලීන දැනුම් වර්ගීකරණයත් ආශ්‍රයෙන් තම පුස්තකාලයෙහි පොත් පත් සංවිධානය සඳහා ක්‍රමවත් පිළිවෙලක් ගොඩනැඟීමට කරන ලද වෑයමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඩිවි දශම වර්ගීකරණය පිළිබඳ අදහස 1873 දී ප්‍රථම වරට ලොවට හෙළිවිය. 1876 දී පිටු 42 ක පොත් පිංචක් (pamphlet) වශයෙන් ප්‍රකාශයට පත් වූ මෙය ශතවර්ෂයකට අධික කාලයක් තිස්සේ විවිධ සංස්කරණ වලට භාජනය වෙමින් ලෝකයේ නොයෙකුත් පුස්තකාල හා ග්‍රන්ථ විඥාපන සේවා ආයතනවල තවමත් භාවිතා වෙමින් පවතී.

ඇන්ග්ලෝ ඇමෙරිකානු රටවල පමණක් නොව ශ්‍රී ලංකාව ඇතුළු දියුණු වෙමින් පවතින රටවල් ගණනාවක ප්‍රමිත වර්ගීකරණ ක්‍රමයක් වශයෙන් භාවිතයට ගෙන ඇති හෙයින් එහි සංශෝධනයන් ප්‍රායෝගික වර්ගීකරණ සංවර්ධනය සම්බන්ධයෙන් කොතෙක් දුරට ඵලදායී වී ඇත්ද යන්න සලකා බැලීම වටී.

## ව්‍යාප්තිය

ඩිවි දශම වර්ගීකරණය මෙතෙක් බිහිවූ වඩාත්ම ක්‍රමානුකූල වර්ගීකරණය යි කිව නොහැකි වුවද, වඩාත්ම ප්‍රචලිතව ව්‍යාප්ත වී ඇති වර්ගීකරණයක් බව කීමට තරම් සාධක ඇත. එය දැනට ලෝකයේ රටවල් 135 ක පමණ භාවිතා කෙරෙන අතර විවිධ භාෂාවන් 30 ක පමණ පරිවර්තනයන් දැනටමත් දැකිය හැක. එක්සත් ජනපදයෙහි පමණක් සියයට අනූපහක පමණ මහජන හා පාසැල් පුස්තකාල වලද, සියයට විසිපහක් පමණ විශ්වවිද්‍යාලයීය හා විද්‍යාලයීය පුස්තකාල වලද, සියයට විස්සක් පමණ විශේෂ පුස්තකාල වලද ඩිවි 20 වන සංස්කරණය භාවිතා වෙමින් පවතී. එසේ වුවත් 1985 න් මෙපිට අවධිය තුළ එක්සත් ජනපදයෙහි ඩිවි දශම වර්ගීකරණයෙහි භාවිතය ක්‍රම ක්‍රමයෙන් අඩුවීමේ ප්‍රවණතාවක් දක්නට ඇත.

විද්‍යාල පුස්තකාල වලින් අඩකටත් වඩා අඩු ප්‍රමාණයක හා විශ්වවිද්‍යාල පුස්තකාලයන් කීපයක පමණක් මෙම ක්‍රමය භාවිතා වන බව පෙනේ. එහෙත් එක්සත් ජනපදයෙන් පිටත එය භාවිතය වඩාත් ජනප්‍රිය වෙමින් පවතී. නැගෙනහිර යුරෝපීය රටවල් හැරුණ විට ඇතැම් මධ්‍ය යුරෝපීය රටවල හා නැගෙනහිර රටවල් කීපයක ඩිවි දශම වර්ගීකරණය දැනටමත් ලෝක ග්‍රන්ථ විඥාපන වර්ගීකරණයක් බවට පත්වී හෝ පත්වෙමින් පවතින බව කිව හැකිය.

ඩිවි දශම වර්ගීකරණය ජාත්‍යන්තරව ව්‍යාප්ත වීමට බලපාන සාධක කීපයක්ම දක්නට ඇත. එක්සත් ජනපදය ඇතුළු ලෝකයේ රටවල් ගණනාවකම භාවිතා කෙරෙන යන්ත්‍රානුසාරයෙන් කියවීම් කළ හැකි සූචි (MARC) පද්ධතීන් මගින් ඩිවි දශම වර්ගීකරණ අංකයන් භාවිතා කරන බව පෙනේ. කොන්ග්‍රස් පුස්තකාලයෙහි ඩිවි දශම වර්ගීකරණ අංශය මගින් වාර්ෂිකව අයත්කර ගන්නා 100,000 අධික පොත් ප්‍රමාණයෙන් උපරිම ප්‍රමාණයකට මෙම අංකයන් යෙදීම කරගෙන යනු ලැබේ. කොන්ග්‍රස් පුස්තකාල පත්‍රිකා (catalogue cards) පරිගණක පටි (computer tapes) හා ප්‍රකාශනය සමඟ සූචිකරණය (cataloguing in publication) මගින් ලෝකයේ විවිධ රටවල පුස්තකාල වලට මෙම අංකයන් සූචිකරණ දත්තයන් සමඟ ව්‍යාප්ත වීමේ හැකියාව දක්නට ඇත. එපමණක් නොව බ්‍රිතාන්‍යය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ඉන්දියාව, ඉන්දුනීසියාව සහ ශ්‍රී ලංකාව වැනි රටවල් ගණනාවකට ජාතික ග්‍රන්ථනාමාවලීන් සඳහා මෙම වර්ගීකරණය අඛණ්ඩව උපයෝගී කරගන්නා ආකාරය දැකිය හැක.

මෙම ග්‍රන්ථ විඥාපන ක්‍රියාවලියෙහිදී භූගෝලීය හා භාෂා භේදයකින් තොරව සාමාන්‍ය වර්ගීකරණයක් වශයෙන් අනෙකුත් වර්ගීකරණයන් අභිභවා ව්‍යාප්ත වී ඇති බව පෙනේ.

## 20 වන සංස්කරණය

1989 දී ප්‍රකාශයට පත්කරන ලද නව සංස්කරණය පරිහරණය පහසුව පිණිස කුඩා කාණ්ඩ 4 කින් යුක්තය.

1 කාණ්ඩය - හැඳින්වීම හා සහායක වගු
2 කාණ්ඩය - 000 - 599 } උප ලේඛන
3 කාණ්ඩය - 600 - 999 }
4 කාණ්ඩය - අනුක්‍රමණිකා හා අත්පොත

සංශෝධිත සංස්කරණයේ අංකයන් ග්‍රන්ථ විඥාපන ආයතන හා පුස්තකාල ගණනාවක් මගින් භාවිතයට ගෙන ඇත. කොන්ග්‍රස් පුස්තකාලය විසින් 1989 දී ද බ්‍රිතාන්‍ය පුස්තකාලය විසින් 1990 දී ද ආරම්භ කරන ලදී.

## නව ලක්ෂණ

නව සංස්කරණය මෙතෙක් කරන ලද සංශෝධනයන්ගෙන් වෙන්ව හඳුනාගත හැකි විශේෂ ලක්ෂණ කීපයකින් යුක්ත විය.

අ. වගු හා උපලේඛන වලදී සටහන්, උදාහරණ හා සාරාංශයන් භාවිතා කිරීම වඩාත් පුළුල් කිරීම

ආ. අංක 780 යටතේ සංගීතය සඳහා සම්පූර්ණ සංශෝධිත උප ලේඛනයක් ඉදිරිපත් කිරීම.

ඇ. ඇතැම් ක්ෂේත්‍රයන් සඳහා ප්‍රමාණවත් සංශෝධනයන් ඉදිරිපත් කිරීම.

ඈ. සාපේක්ෂ අනුක්‍රමණිකාව වඩාත් අර්ථවත්ව භාවිතයට පහසුවන සේ ප්‍රමාණයෙන් කුඩා කිරීම.

ඉ. 1982 දී වෙනම ප්‍රකාශයට පත්කරන ලද ඩිවි දශම වර්ගීකරණය භාවිතය පිළිබඳ අත්පොත (Comaromi, 1982) 4 වන කාණ්ඩයෙහි අනුක්‍රමණිකාව සමඟ ඉදිරිපත් කිරීම.

සමස්තයක් වශයෙන් ගත් කල චක්‍ර හා උප ලේඛනවල තැනින් තැන බහුලව යොදාගෙන ඇති සටහන් හා සාරාංශයන් වර්ගීකරණයේදී සහයෝගී මඟ පෙන්වීමකට යොමු කරවයි.

## උදාහරණ

519.5 ක්‍රීඩා න්‍යාය (Game theory)

ගණිතමය ප්‍රශස්ථකරණය (Mathematical optimization) මෙහි වර්ග කරන්න.

පාලන න්‍යාය (Control theory) 515.64 හි ද සම්භාවන ක්‍රීඩා (Games of chance) 519.2 හි ද වර්ග කරන්න.

සමායුක්ත විශ්ලේෂණයන්හි (Combination analysis) ප්‍රවරණය හා තීරණය ගැනීම (choice and decision making) සඳහා 511.68 ද බලන්න.

මෙහි දී ඥාති විෂයයන් අතර සම්බන්ධතාව වඩාත් පැහැදිලි කිරීම සඳහා 'ද බලන්න' විමර්ශනය උපයෝගී කරගෙන ඇති බව පෙනේ.

## සාරාංශය

සාරාංශ මගින් පංතීන්වල බුද්ධිමය ව්‍යුහය හා අංකමය ව්‍යුහය පිළිබඳ පූර්ණ අවබෝධයක් ඇති කරවීමට උත්සාහ ගෙන ඇති බව පෙනේ. ප්‍රධාන වශයෙන් තුන් ආකාරයක සාරාංශයන් යොදාගෙන ඇත.

අ. උපලේඛන ආරම්භයේදී දක්වා ඇති තුන් වැදැරුම් උපලේඛන සාරාංශ (Schedule summaries). (කාණ්ඩ 2 හි 1 × - ×× පිටු)

ආ. තනි පරිමාණ සාරාංශ (Single level summaries) මේවා බොහෝවිට පිටු දෙකකට වඩා විෂය උප බෙදුම් ව්‍යාප්තවන අවස්ථාවලදී යොදාගෙන ඇත.

උදා: 658.401 සැළසුම් කිරීම, ප්‍රතිපත්ති තීරණ ගැනීම හා පරිපාලනය
658.402 අභ්‍යන්තර සංවිධානය
658.403 තීරණ ගැනීම හා තොරතුරු කළමනාකරණය
658.404 ව්‍යාපෘති කළමනාකරණය
658.406 කළමනාකරණ වෙනස්වීම්
658.407 විධායක පිරිස් කළමනාකරණය
658.408 විධායක කළමනාකරණයේ සමාජ වගකීම
658.409 විධායක කළමනාකරණයේ පෞද්ගලික වටිනාකම

ඇ. බහු පරිමාණ සාරාංශ (Multi-level summaries) මේවා ප්‍රධාන බෙදීම් සහ ඇතැම් ප්‍රාදේශීය චක්‍ර සඳහා යොදාගෙන ඇති බව පෙනේ.

උදා: 370 අධ්‍යාපනය (කාණ්ඩ 2 හි 595-596 පිටු)

4 යුරෝපය. මධ්‍ය යුරෝපය (කාණ්ඩ 1 හි 48-49 පිටු)

මෙවැනි විවිධ මට්ටමේ සාරාංශයන් මගින් බැලූ බැල්මට අංකනය ව්‍යාප්ත වී ඇති ආකාරය දිස්වෙයි. විෂය සම්බන්ධතාවය ගොඩනැගී ඇති ආකාරය ගැනද අවබෝධයක් ඇති කරවීමට ආධාර වෙයි.

## චක්‍ර

ඩිවි දශම වර්ගීකරණයට අනුව උපලේඛනයෙහි දී ඇති විෂය අංකයන් සමඟ තවදුරටත් චක්‍රවල දක්වා ඇති අංකයන් එකතු කිරීමෙන් අභිමත පරිදි නියත වර්ගීකරණය සඳහා යොමුවිය හැකිය. නව සංස්කරණයෙහි මෙම චක්‍රයන් දෙවර්ගයක් පැහැදිලිව වෙන්කොට දක්වා ඇත.

1. පළමුවන කාණ්ඩයෙහි කැපිටල් T අකුර සමඟ 1-7 දක්වා සඳහන් චක්‍ර

2. මුළු වර්ගීකරණ උපලේඛනයන්හි සහ චක්‍ර 7 හි ඉඳහිට දක්වා ඇති 'එකතු කරන්න' සටහන සමඟ යොදා ඇති වින්‍යාස කරන ලද අංක සමූහයන් එකතු කිරීමේ චක්‍ර වශයෙන් හැඳින්විය හැකිය.

මුල් ගණයට අයත් 18 වන සංස්කරණයේ සිට වර්ගීකරණ උප ලේඛනයෙන් වෙන්කරන ලද මෙම චක්‍රයන් 20 වන සංස්කරණයේදී වඩාත් සංශෝධනයකට ලක්වී ඇති බව පෙනේ.

T 1 ප්‍රමිත උප බෙදුම්
T 2 භූගෝලීය ප්‍රදේශ, ඓතිහාසික යුග, පුද්ගලයන්
T 3 විශේෂ සාහිත්‍ය රූපක සඳහා සාහිත්‍ය උප බෙදුම්
T 3 -A තනි කතෘ හෝ තනි කතෘන් පිළිබඳ කෘති සම්බන්ධ උප බෙදුම්
T 3 -B එක් කතෘවරයකුට වඩා වැඩි අයගේ කෘති හෝ ඔවුන් පිළිබඳ කෘති සම්බන්ධ උප බෙදුම්
T 3 -C අංක 3-චක්‍රයෙහි සහ අංක 808-809 හි දී ඇති උපදෙස් අනුව එකතු කළයුතු අංකයන්-
T 4 භාෂා උප බෙදුම්
T 5 වාර්ගික, ගෝත්‍රිය හා ජාතික උප බෙදුම්
T 6 භාෂා බෙදුම්
T 7 පුද්ගල කණ්ඩායම්

මේවා සියල්ල තනිව යෙදිය හැකි අංකයන් නොවේ. අංකයන් කෙටි ඉර සහිතව යොදා තිබීමෙන් අදහස් කරනුයේ සෑම විටම වර්ගීකරණ උප ලේඛණයේ එන විෂය අංකයන් සමඟ සංයෝග කළයුතු බවය. ඒ නිසා මේවා සහායක චක්‍රයන් ලෙස හැඳින්විය හැකිය. ඇතැම් අවස්ථාවලදී එක චක්‍රයක එන අංකයක් තවත් චක්‍රයක එන අංකයක් සමඟ යෙදිය හැකිය.

උදා: 025 පුද්ගල හා සංවිධාන නාම ලේඛන සංග්‍රහ
025 පදනම් අංකයට අංක 2 චක්‍රයෙහි එන 3-9 දක්වා අංකයන් එකතු කරන්න. ඒ අනුව 025.771 ඔහියෝවල පුද්ගල හා සංවිධාන නාම ලේඛන සංග්‍රහ

ප්‍රමිත උප බෙදුම්වල දක්නට ඇති විශේෂ ලක්ෂණයක් නම් ඒවා ඕනෑම විෂයකට පොදුවේ එකතු කිරීමට ඇති හැකියාවය. එහෙත් උප ලේඛනයෙහි එම අංකයන් වෙනස්ව යෙදෙන අවස්ථා ගැන පරීක්ෂාකාරී විය යුතුවෙයි. ඇතැම්විට විශේෂ අරමුණක් සඳහා අංකනය තනි බිංදුවකින් ආරම්භ වන්නේ නම් ප්‍රමිත උප බෙදුම් සඳහා 001-009 දක්වා අංකයන් යෙදීමට සිදුවෙයි.

උදා 361 සමාජ ප්‍රශ්න හා සාමාන්‍ය සමාජ සුභ සාධනය
361.001-008 ප්‍රමිත උප බෙදුම්

තවත් සමහරක් අවස්ථාවලදී අංකනය බිංදුවකින් ආරම්භ වී ඇති අතර විශේෂ අර්ථයක් සඳහා බිංදු දෙකක්ම යොදාගෙන ඇත්නම් ප්‍රමිත උප බෙදුම් සඳහා 0001-0009 දක්වා අංකයන් යෙදීමට උපදෙස් දී ඇත.

උදා: 351 මධ්‍යම ආණ්ඩු පරිපාලනය
351.0001-0009 ප්‍රමිත උප බෙදුම්

සෑම සහායක චක්‍රයන් ආරම්භයේදීම ඒවා යොදන ආකාරය ගැන උපදෙස් දී ඇත. අතිරේක වශයෙන් 20 වන සංස්කරණයට එකතුකර ඇති අත් පොතෙහි දී ඇති ප්‍රයෝගික වර්ගීකරණය සම්බන්ධයෙන් අවශ්‍යවන සටහන්, උපදෙස් හා විෂය සම්බන්ධතා විමර්ශනයත් නිසා පළපුරුද්දෙන් අඩු කෙනෙකුට වුවද පහසුවෙන් එම වර්ගීකරණය අනුගමනය කිරීමේ හැකියාව ඇති කරවයි.

## උපලේඛනවල දක්නට ඇති වැදගත් සංශෝධන

මෙහි දක්නට ඇති බොහෝ සංශෝධනයන් ලොව පුරා ඩිවි දශම වර්ගීකරණය භාවිතා කරන අයගේ විශේෂ අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් කරන ලද ඒවාය. (Bankole, 1990) ඇතැම් ඒවා භාවිතාකරුවන් විසින් වසර ගණනාවක් තිස්සේ කරන ලද ඉල්ලීම්වල ප්‍රතිඵලයන් වශයෙන් සැලකිය හැකිය. සාමාන්‍යයෙන් වර්ගීකරණ ක්‍රමවල දක්නට ඇති සියලුම සංශෝධනයන් ප්‍රධාන කොටස් 4 කට බෙදිය හැකිය.

අ. සාමාන්‍ය සංශෝධන (Routine revisions)
මෙහිදී කාලානුරූපව පදමාලා සකස් කිරීම පැහැදිලි කිරීමේ සටහන් යෙදීම හා අවශ්‍ය ප්‍රසාරණයන් සැපයීම අරමුණු කෙරේ.

ආ. ප්‍රමාණවත් සංශෝධන (Substantial revisions)
මෙහිදී යම් පංතියක් සම්බන්ධයෙන් මූලික නැවත විග්‍රහයක් හා අර්ථවත් පිහිටුවීමක් අදහස් කෙරේ.

උදා: 628 සනීපාරක්ෂක හා මහ නගර සහා ඉංජිනේරු විද්‍යාව

ඇ. සවිස්තර සංශෝධන (Extensive revisions)
මෙහිදී ප්‍රධාන උපලේඛන සාරාංශයෙහි වෙනසක් නොවන අතර උප බෙදුම්වල මූලික වෙනස්වීම් තුලනාත්මක චක්‍රයකින් දක්වනු ලැබේ. එහෙත් මෙවැනි සංශෝධනයන් 20 වන සංස්කරණයෙහි දක්නට නැත.

ඈ. සම්පූර්ණ සංශෝධන (Complete revisions)
18 හා 19 වන සංස්කරණවල 'ෆීනික්ස් චක්‍ර' (Phoenix tables) වශයෙන් හඳුන්වන ලද ඒවා 20 වන සංස්කරණයෙහිදී මේ නමින් හඳුන්වා ඇත. පදනම් අංකය නො වෙනස්වී තිබුණද සියලුම උපබෙදුම් සම්පූර්ණයෙන්ම වෙනස් කිරීමක් මෙහිදී සිදු කෙරේ.

උදා 780 සංගීතය
T 2-711 බ්‍රිතාන්‍ය කොලොම්බියාව
968 දකුණු අප්‍රිකාව
982 ජපානය

නව සංස්කරණයේදී අලුතින් හඳුන්වා දී ඇති සම්පූර්ණ සංශෝධනයන් ඊට වසර ගණනාවකට පෙර වෙන්ව පළකරන ලද ප්‍රචලිතව තිබූ ෆීනික්ස් උපලේඛනයන්ය.

උදා: 004-006 දත්ත සැකසීම හා පරිගණක විද්‍යාව
780 සංගීතය

මෙයින් පළමුවැන්න 1985 දී ප්‍රකාශයට පත්කරන ලද අතර එය කලින් පරිගණක විද්‍යාව වෙනුවෙන් වෙන්කර තිබූ 001.6 ට වඩා ක්‍රමානුකූල බවත් හා අංකනයේ ව්‍යාප්තියත් පිළිබිඹු කරයි.

මෙහිදී ඇතැම් විෂයයන් වඩාත් නියත පියවරකට ගෙනයාමට හැකියාව මෙන්ම දත්ත හා දත්ත පදනම් එක්තැන් කිරීමට ඉඩකඩ සැලසී ඇත. එසේ වුවත් තවමත් ඇතැම් නූතන විෂයයන් සඳහා උපලේඛනයේ අසම්පූර්ණතා හා වෙහෙසකරවන හිදැස් දුෂ්කරතා (Rooke, 1987) දක්නට ඇත.

අංක 780 සංගීතය යටතේ දක්වා ඇති සංශෝධනය බොහෝ දුරට 1960 දී ප්‍රකාශයට පත්කරන ලද ඊ. ජේ. කොට්ස්ගේ බ්‍රිතාන්‍ය සංගීත වර්ගීකරණ සූචිය (British Catalogue of Music Classification) මත පදනම් වී ඇත. එය වඩාත් මුඛාශ්‍රිත වර්ගීකරණ ලක්ෂණ වලින් යුක්තය. අලුත් උපලේඛනවල යොදාගෙන ඇති විශේෂ මුඛාශ්‍රිත යුක්තීන් නිසා රඟුම් මාධ්‍යය අනුව ඒකීය ක්‍රමයකට විෂයයන් බෙදා ඇති බව පෙනේ.

| | |
|---|---|
| 780 | සංගීතය |
| 781 | සාමාන්‍ය මූලධම් හා සංගීත රූපණ |
| 782 | ස්වර සංගීතය |
| 783 | ධ්වනිය |
| 784 | භාණ්ඩ සංගීතය |

මෙහිදී අංක 789 සංගීත රචකයන් හා සංගීත සම්ප්‍රදායන් සඳහා වරණීය වශයෙන් යෙදිය හැකිවන සේ වෙන්කොට ඇත. තවත් විශේෂ ලක්ෂණයක් නම් 0 හා 1 යන අංකයන් මුහුණත් හඳුනා ගැනීමේ සංකේතයන් වශයෙන් භාවිතා කර තිබීමයි.

උදා: 784.2092BEE බීතෝවන්ගේ ඔකෙස්ට්‍රා සංගීතය

786.21872 බීතෝවන්ගේ පියානෝ
සංගීතයෙහි ෆ්‍යුග් සංගීත විශේෂය

මේ නිසා ඩිවි දශම වර්ගීකරණය කෝලන් වර්ගීකරණය මෙන් වඩ වඩාත් සංයෝගාත්මක හැකියාවන් ඔස්සේ ගමන් කරන බව පෙනේ (Svenonius, 1981)

### සාපේක්ෂ අනුක්‍රමණිකාව

මෙම පුස්තකාල සේවය සඳහා තෝරාගනු ලබන පොත් පත් පාඨක අවශ්‍යතා අනුව ඉටුවීම ඉතා වැදගත්ය. පාඨකයන්ට අවශ්‍ය නොවන කියවීමට රුචි නොකරන පොත්පත් ජංගම සේවය සඳහා තෝරා නොගත යුතුය. මෙම කුඩා පුස්තකාලයේ තැබිය හැකි පොත් ප්‍රමාණය ඉතා ස්වල්ප බැවින් (සාමාන්‍යයෙන් ලොකු වාහනයක් නම් පොත්පත් 2500-3500 අතර ප්‍රමාණයක් වේ.) පාඨක අවශ්‍යතා හඳුනාගෙන පොත් පත් තේරීම කළ යුතුය. පාපැදියක පොත් පෙට්ටියක් බැඳගෙන යන පිරිසර බද ජංගම සේවයකදී නම් මෙම තේරීම ඉතාමත් කල්පනාකාරීව කළ යුතුයි. සෑම පොතක් සඳහා එය කියවීමට පාඨකයෙකු සිටිය යුතුය. හැමදාම එකම පොත් තොගය පවත්වාගෙන යාම නොකළ යුතු අතර පාඨක අවශ්‍යතාවයනට අනුව එය කාලීනව වෙනස් කළ යුතුය. අලුත් පොතපත සැපයීම මෙහිදී වැදගත් වේ. පාඨකයා පුස්තකාලය වෙත ඇති උනන්දුව හා ඇල්ම ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වීමට ඉවහල් වන පරිදි ග්‍රන්ථ සම්භාරය සංයුක්ත විය යුතුය. මෙම පොත්පත් සංවිධානය කළ යුත්තේ ද පාඨක පහසුව ද සලකමිනි. සීමිත ඉඩකඩ නිසා ශාඛා පුස්තකාලයක මෙන් විධිමත්ව

සංවිධානය කිරීම අපහසු වුවත් තමාට අවශ්‍ය පොත්පත් කල්වේලා නොඉක්මවා පහසුවෙන් තෝරා ගැනීමට හැකි සෑම පහසුකමක්ම සැලැස්විය යුතුය. පොත්පත් තෝරා ගැනීමේ පහසුව ඇති කාඩ්පත් සුචිපත් පහසුකම්ද නොමැති බැවින් ජංගම පුස්තකාලයාධිපතිවරයා විසින් පොත්පත් තෝරා ගැනීමේදී පාඨකයාට නිතරම මඟ පෙන්වීමට හා උදව් කිරීමට සූදානම්ව සිටිය යුතු වෙයි.

ජංගම පුස්තකාල සේවය නිසි සැලැස්මක් අනුව නියමිත වැඩසටහනකට අනුව ක්‍රියාත්මක විය යුතුය. පුස්තකාලය භාවිතා කරන පාඨකයා තමා වෙතට ජංගම රථය පැමිණෙන දිනය, වේලාව කල්තබා දැන සිටිය යුතු බැවිනි. නියමිත දිනයේ නියමිත වේලාවට ජංගම රථය සේවා මධ්‍යස්ථානයට පැමිණිය යුතුය. මේ සඳහා වාහන වල ක්‍රියාකාරිත්වය ඉතා වැදගත්ය. නිතර නිතර අබලදුබල වන වාහන මගින් පවත්වන ජංගම සේවා මගින් කාර්යක්ෂම සේවාවක් බලාපොරොත්තු විය නොහැක. සාර්ථක සේවාවක් සැපයීම සඳහා ජංගම සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලයද ඉතා වැදගත් වේ. සේවයටම කැපවුනු කාර්යක්ෂම එසේම මහජනයාට ප්‍රියමනාප වෘත්තීය පුහුණුව ලත් පුස්තකාලයාධිපතිවරයෙකුගේ සේවය මෙහිදී වැදගත් ය.

ජංගම පුස්තකාල සේවා සඳහා සේවා මධ්‍යස්ථාන තෝරා ගැනීමේදී ප්‍රජා මණ්ඩල මහජන පොළවල් නිවාස යෝජනා ක්‍රම ආදි මහජනයා වැඩි වශයෙන් පැමිණෙන ස්ථාන තෝරා ගැනීම සාමාන්‍යයෙන් සිදුවේ. සාප්පු සවාරියේ යන ගමන් නැතිනම් වෙළඳ පොළින් බඩුබාහිර මිළයට ගන්නා අතර තුර ජංගම පුස්තකාලයට පැමිණ පොතක් ද රැගෙන යාමට පුළුවන. කම්හල් ශාලාවක හෝ කාර්යාලයකදී නම් කෑම විවේකයේදී ජංගම රථය පැමිණෙන විට තමන්ට අවශ්‍ය පොත්පත් ලබාගත හැක. මෙය පාඨකයාගේ කාලය ඉතුරු කරන අතර ඔහුගේ පහසුව සඳහා ද හේතුවේ. ගම්බද නම් ගම්බද ජනතාව වැඩි වශයෙන් එක්තැන් වන පන්සල්, ප්‍රජා මණ්ඩල, මහජන පොළවල් ආදි ස්ථාන සුදුසු වේ.

## ජංගම පුස්තකාල සේවාවන් පැවැත්වීමේ වැදගත්කම

ජංගම පුස්තකාල සේවාවක් පවත්වාගෙන යාම මහජන පුස්තකාලයකට තම පුස්තකාලයට පැමිණීමට අපහසු පාඨකයන්ට සැලසිය හැකි අගනා සේවාවකි. පුස්තකාලයේ බිත්ති හතරටම සීමා නොවී ජනතාව සමීපයට ගොස් සේවාවන් පැවැත්වීමේ හැකියාව මේ මගින් ලැබේ. අනාගතයේදී ස්ථිර පුස්තකාල පහසුකම් ඇතිකළ යුතු ස්ථාන (එනම් ශාඛා පුස්තකාල) ඇති කල යුතු ස්ථාන නිගමනය කිරීමට මේ මගින් හැකියාව ලැබේ. ප්‍රමාණය අතින් ඉතා සීමිත පොත් එකතුවක් වුවද එම එකතුවෙන් උපරිම ප්‍රයෝජනය ගැනීමට පාඨකයාට ඉඩකඩ ලැබේ. ජනගහනය භූගෝලීය වශයෙන් වේවා සාමාජික වශයෙන් වේවා විසිරී ඇති ප්‍රදේශ වල පුස්තකාල සේවාවන් සැපයීමේදී වඩාත් නුවනට හුරු ක්‍රමය මෙය වේ. ප්‍රධාන පුස්තකාලයට හෝ ශාඛා පුස්තකාලයට හෝ පොත්පත් ලබා ගැනීමට වැය වන කාලය ගමන් ගාස්තු ඉතිරි වේ. එමෙන්ම විවේක කාලය අර්ථවත්ව ගත කිරීමට උදව් වේ. පාසැල් පුස්තකාල නැති අවස්ථාවලදී එම කර්තව්‍යද තරමක් දුරට හෝ ඉටු කරගත හැක. එමෙන්ම ගැඹුරට අධ්‍යාපනය කරන පාඨකයනට ඒ සඳහා ලඟම පිහිටි ශාඛා පුස්තකාලයට හෝ මධ්‍ය පුස්තකාලයට යාමට අනුබලයක් හා උනන්දුවක් ලබා දීමට හැකියාව ලැබේ.

පාඨකයා තුළ කියවීමේ පුරුද්ද ව්‍යාප්ත කිරීමටද බෙහෙවින් සාර්ථක වූද ප්‍රායෝගික වූද ක්‍රමයකි ජංගම පුස්තකාල සේවාව. කුඩා ළමුන් සඳහාද වෙනම ජංගම සේවා ඇති කිරීමෙන් ළමුන්ගේ කියවීමේ රුචිය වර්ධනය කල හැකිය. මෙම ජංගම පුස්තකාලවලින් ලැබෙන පොත් තොගය වරින් වර කියවා කියවීමේ පුරුද්ද ඇති කර ගත් දරුවා ඊළඟට ළඟම ඇති පුස්තකාලය වෙත තව තවත් පොත්පත් කියවීමට පිය නගයි. ජංගම රථයකදී නම් ජංගම පොත් ප්‍රදර්ශනයද ඒ ඒ සේවා මධ්‍යස්ථානවලදී පැවැත්වීමට ක්‍රියා කරයි නම් එයද කියවීමේ රුචිය වැඩි කිරීමට මහඟු උපකාරයකි.

ලිවීමේ, කියවීමේ හැකියාව එනම් සාක්ෂරතාව ඇති අයගේ සංඛ්‍යාව අප රටේ 89% ක් පමණ වුවද කියවීම පුරුද්දක් වශයෙන් පවත්වාගෙන යන ජනතාව සාපේක්ෂ වශයෙන් ඉතා සුළු පිරිසකි. බොහෝ විට මෙයට හේතු වී ඇත්තේ කියවීමට මිඩංගු කිරීමට ඇති කාලය අල්ප වීමට වඩා කියවීමට තමන් රුචි කරන පොත්පත් හිඟකම පුස්තකාල පහසුකම් නොමැතිකම ආදී විවිධ හේතූන්ය. විශේෂයෙන් ගම්බද ප්‍රදේශවල කියවීමට රුචි කරන පාඨකයන් බහුලව සිටියද ඔවුනට කියවීමේ පහසුකම් ඉතා සීමිතය. පුස්තකාල පහසුකම්ද ඉතා අඩුය. මධ්‍යම පුස්තකාලයක් කේන්ද්‍රස්ථානය කරගෙන එම ප්‍රදේශයේ නොදියුණු, පුස්තකාල පහසුකම් අඩු ප්‍රදේශ කරා ජංගම සේවා සැලැස්වීමෙන් වටිනා පුස්තකාල සේවාවක් එම ජනතාවට සැලසිය හැකිය.

© එම්. ඩී. එච්. ජයවර්ධන *1992*

# ලේඛන කලාවේ ප්‍රභවය

**ජ්. ලගමුව**

සහකාර පුස්තකාලයාධිපති
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

කථා ව්‍යවහාරය හා ලේඛන ව්‍යවහාරය යන මාධ්‍ය දෙකෙන්ම භාෂාව පරිහරණය කිරීම ලෝකයේ දියුණු ශිෂ්ඨාචාරයක් ඇති සමාජයන්හි දක්නා ලැබෙන්නකි. එක්තරා ප්‍රමාණයකට දියුණු ශිෂ්ඨාචාරයක් ඇති සමාජයක භාෂාව මෙම මාධ්‍ය දෙකෙන්ම පරිහරණය කරණ හා කෙරුණ බව පෙනෙතත් අද පවා බොහෝ භාෂා කථා මාධ්‍යයෙන් පමණක් ව්‍යවහාර වන බව පෙනේ. ඇතැම් විටක කිසියම් භාෂාවක ලේඛන මාධ්‍ය ආරම්භ කරන ප්‍රවෘත්තිය අසන්නට ලැබේ. මනුෂ්‍ය භාෂාව කෙසේ ආරම්භ විනි දැයි නිශ්චිතව කිව නොහැක. එසේ වුවත් පළමුවෙන්ම ආරම්භ වූයේ කථා මාධ්‍ය බව නම් නිශ්චිතය. මීට හේතුව අප දන්නා තරම් දුරට මනුෂ්‍ය වර්ගයාගේ අතීතය පරීක්ෂා කරද්දී ලේඛන ව්‍යවහාරය ආරම්භ වූයේ කුමන අවදියේ දැයි අනුමාන කිරීමට හැකි නමුත් කථා මාධ්‍ය ආරම්භ වූ අවදිය ඊට ඔබ්බේ වූ අඳුරු අතීතයේ සැඟවී පවතින සිද්ධියක් වන බැවිනි. මේ පිළිබඳව කේ. එන්. ඕ. ධර්මදාස ගේ අදහස් ඉතා වැදගත්ය. ඔහු 'අප දන්නේ මනුෂ්‍යයා තමා සතුව බොහෝ කාලයක් පැවැති කථා මාධ්‍ය පදනම් කරගෙන පසු කාලයක දී ලේඛන මාධ්‍ය නිපදවා ගත් බව පමණකි. මේ අනුව මනුෂ්‍ය ශිෂ්ඨාචාරයේ මුලින් පහළ වූයේ කථා ව්‍යවහාරය බවත් ලේඛන ව්‍යවහාරය එය පදනම් කොට ගෙන බිහි වූ දෙවැනි මාධ්‍යයක් බවත් පැහැදිලිය 'යි පවසයි. ආර්. එච්. රොබින්සන් 'අ ෂෝර්ට් හිස්ට්‍රි ඔෆ් ලින්ග්විස්ටික්ස්'[1] නම් කෘතියේ මීට සමාන අදහස් දක්වයි. එඩ්වඩ් සැපියර් තම 'ලැන්ග්වේජ්[2]' නම් ග්‍රන්ථයේ සටහන් කළ 'ලිඛිත ස්වරූප වනාහී කථා ව්‍යවහාරගත ස්වරූපයන් හි ද්විතියික සංකේතය. එනම් සංකේතයන් හි සංකේතය ' යන අදහස් තුළින් අපගේ අදහස තව දුරටත් තහවුරු වෙයි. කෙසේ වුවත් ලේඛන ව්‍යවහාරය ක්‍රි. පූ. 20,000 පමණ විවිධ චිත්‍ර සංකේත මගින් ඇරඹී අංග සම්පූර්ණ භෝඩියක් ක්‍රි. පූ. 4000 පමණ සිට ආරම්භ වූ බව ඩේවිඩ් ඩිරින්ජර් ගේ මතයයි.

'අග්‍ර ශබ්ද න්‍යාය' හෙවත් චිත්‍රයකින් අදහසක් පැවැසීමේ අවස්ථාවන් වන 'එම්බ්‍රියෝ රයිටින්' හෙවත් බීජ ලේඛනයන් 'සෙමිසියෝ ග්‍රැෆි' හෙවත් ශබ්දාර්ථ විද්‍යාවත් ආරම්භ වූයේ හේතු 3 ක් මත බව විද්වතුන් ගේ අදහස වී ඇත. එනම්,

1. සන්නිවේදනයක් හෙවත් ප්‍රකාශනයක් කිරීමේ පරමාර්ථය.
2. සෞන්දර්යාත්මක පරමාර්තය.
3. හූනියම් කර්මයක් (Black Magic) හෝ ශාන්ති කර්මයක් පිළිබඳ පරමාර්ථ යනුවෙනි.

කෙසේ වුවත් මෙවැනි නොයෙකුත් ජ්‍යාමිතික රටා, මෝස්තර හා සතුන් ආදී දර්ශන ඉහළ පැලියොලිතික යුගයේ සිට උතුරු හා නැගෙනහිර ස්පාඤ්ඤයේ ද දකුණු හා බටහිර ප්‍රංශයේ ද උතුරු යුරෝපයේ ද උතුරු අප්‍රිකාවේ ද හමු වන බව ඩේවිඩ් ඩිරින්ජර්[3] පවසයි. මෙම චිත්‍ර ලේඛනයේ ඉහළම අවස්ථාව ෆොනොග්‍රැෆි (phonography) නම් වෙයි. ලේඛන ක්‍රමයේ අංග සම්පූර්ණ අවස්ථාව එනමින් හැඳින්වේ. මෙම ලේඛනද ලෝකයේ බොහෝ ස්ථාන වලින් ලැබී තිබේ.

අනෙකුත් සතුන් ගෙන් මිනිසා ප්‍රධාන වශයෙන් වෙනස් වන්නේ දියුණු මොළයක් ඇති බැවිනි. මිනිසාගේ මොළය ක්‍රමයෙන් දියුණු වූ ආකාරය මිනිස් පරිණාමය දෙස බලන විට පෙනෙයි. ගොරිල්ලා ගේ මොළයේ ධාරිතාව සී. සී. 600 ද ජාවා මිනිසා ගේ සී. සී. 835 බුෂ්මාන් ගේ සී. සී. 1225 ද මිනිසා ගේ සී. සී. 1425 ද වෙයි. මේ අනුව දියුණු මොළයක් තිබීමත් අත පය ආදී අවයව තිබීමත් ඒවා භාවිත කිරීමත් ලේඛන ක්‍රමයක ආරම්භයට හේතු විය. සන්නිවේදනයක් පැවැත් වීමට කරුණු කීපයක් සම්පූර්ණ විය යුතු ය. යමෙක් යම් මාධ්‍යයක් මගින් යමක් පිට කිරීම (උදා: ලිවීම) එය ග්‍රහණය කරන්නෙක් සිටීම මෙම අවස්ථා දෙකේදී ශාරීරික මූල ධර්ම යොදා ගැනීම යනුයි. මෙවැනි ක්‍රියාවලියක් අනුගමනය කළ හැක්කේ මිනිසාට පමණි. එහෙයින් කථා ව්‍යවහාර මාර්ගයෙන් භාෂාව නිපදවා ගැනීමටත් ලේඛන ව්‍යවහාර මාධ්‍යයෙන් එය වැඩි දියුණු කර ගැනීමටත් හැකි විය.

වනචාරී මිනිසා ශිෂ්ඨාචාර ගත වූයේ කරුණු දෙකක් මගින් බව මානව විද්‍යාඥයෝ කියති. වනගත බවින් ඉවත් වීමත් හොඳ සිරිත් විරිත් නීති රීති, විද්‍යාව කලාව හා භාෂාව පිළිබඳ හික්මීමත් යන දෙකරුණයි. මේ අනුව ශිෂ්ඨාචාරගත වීම භාෂාවක් කථා ව්‍යවහාරයෙන් ඇති වීමටත් ශිෂ්ඨාචාරය සංවර්ධනය වීම ලේඛන මාධ්‍ය බිහි වීමටත් හේතු වූ බව සමහරෙක් පවසති. මෙසේ ලේඛන ක්‍රමය ඇති වන්නේ ශිෂ්ඨාචාරය සංවර්ධනය වීමත් සමඟම ලේඛන මාධ්‍ය යොදා ගැනීම අත්‍යවශ්‍ය වීම නිසාය. දියුණු ශිෂ්ඨාචාරයක් ඇති සමාජ සමඟ සම්බන්ධතා ඇති වීම නිසා තමාත් සංවර්ධනය වීමේ අවශ්‍යතාව ප්‍රත්‍යක්ෂ කර ගන්නා මෙතෙක් කල් ලේඛන මාධ්‍යයක් නොතිබුනු භාෂා සමාජ විසින් ලේඛන ව්‍යවහාරය ආරම්භ කරනු ඇත.[4] මෙයින් පෙනෙන්නේ ශිෂ්ඨාචාරය සංවර්ධනය වීමත් එය සංකීර්ණ වීමත් එහි අවශ්‍යතාවයන් බහුල වීමත් නිසා ලේඛන මාධ්‍ය බිහි වූ බවයි.

භාෂා ද්විරූපතාවයේදී කථන භාෂාවේ ප්‍රදේශ, ජාතීන්, ජන කොටස්, කුළ හා පංති වශයෙන් උප භාෂා රාශියක් පවතී. ආදි යුගයේ දී ප්‍රාදේශීය උප භාෂා තිබෙන්නට ඇත. වර්තමානයේ චීන භාෂාවේ ලේඛනය එකම ස්වරූපයේ පැවැතුන ද භාෂණයේ දී උපභාෂා සයක් මැන්ඩරින්, කැන්ටනීස්, වූ , උතුරු මින්, දකුන් මින්, හක්කා යනුවෙන් තිබෙන බව එම්. ඒ. කේ. හැලිඩේ (M. A. K. Halliday) පවසයි. එසේම අරාබි භාෂාවේ ප්‍රාදේශීය උපභාෂා රාශියක් ඇත. මොරොක්කෝව, ඇල්ජීරියාව,

ලිබියාව, සූඩානය, මිසරය, ලෙබනනය, ජෝර්දානය, සිරියාව, ඉරාකය, සව්දිඅරාබිය, ඕමානය යනාදි ප්‍රදේශ වල උප භාෂා රාශියක් ඇති බවත් ලේඛන ව්‍යවහාරය එකක් බවත් පෙනේ. කථා ව්‍යවහාරයේ උප භාෂා රාශියක් තිබීමත් ඒවා ප්‍රදේශ දෙකක එක සමාන නොවීමත් තේරුම් ගත නොහැකි වීමත් ලේඛන ව්‍යවහාර මාධ්‍ය බිහි වීමට හේතු වන්නට ඇත. ලේඛන ව්‍යවහාරය තුළ උප භාෂා නොමැත.

කථා ව්‍යවහාර භාෂාව මතකයේ රඳවා ගත යුතුය. එසේ නොවන්නේ නම් ඉන් ප්‍රයෝජන නොලැබෙයි. යමෙක් යමක් ප්‍රකාශ කළ පසු එය සිහි තබා ගැනීම කාර්‍ය බහුල මිනිසාට අපහසු විය. එසේ කතා ව්‍යවහාරය හෙවත් ස්මෘතිය කලක් ගත වන විට වෙනස් වෙයි. එබැවින් ලේඛන මාධ්‍ය නිපදවා ගන්නට ඇත. ලේඛණ මාධ්‍ය නිපදවා ගත් පසු කරන ලද්දේ එතෙක් කල් කථා ව්‍යවහාරයෙහි පැවැති භාෂාව ලේඛන මාධ්‍යට පරිවර්තනය කිරීමයි. කෙතරම් භාවිත කළද විනාශ වීමක් ගෙවීමක් නැති බැවින් වර්ණයන්ට අක්ෂර යැයි කියනු ලැබේ. අක්ෂරයෝ මහා මූලයේ දී පවා විනාශ නොවී පවත්නා බව ශ්වේතා ශ්වතර උපනිෂදයේ ද තන්ත්‍රයන්ගේ ද දක්වා ඇත. මෙසේ බොහෝ කළක් එකසේ පැවැතීමත් විනාශ නොවීමත් මතකයට හෙවත් තොරතුරු තැන්පත් කර තබා ගැනීමට පහසු වීමත් නිසා ලේඛන බිහි විය. එම ලේඛනද ක්‍රම කිහිපයකට බෙදා විද්වත්හු දක්වති. මෙවැනි ලේඛන ක්‍රම 5 ක් වරාහි තන්ත්‍රයේ දක්වයි. යවමංග ජෛන සූත්‍රයේ ලේඛන 18 ද නන්දි සූත්‍රයේ 33 ද වශිෂ්ඨ ධර්ම සූත්‍රයේ ලිපි වර්ග 2 ද දක්වා ඇත.[5] කෙසේ වුවත් මෙසේ ලිඛිත වූවක් කල් තබා ගැනීමත් විනාශ නොවීමත් නිසා ලේඛනය ඉතා පහසු ජනසන්නිවේදන මාර්ගයක් ආදි බව මිනිසා වටහා ගත්තේ ය. කථා ව්‍යවහාරයේ පවතින භාෂාව කාලයාගේ ඇවෑමෙන් වෙනසට භාජනය වන බව අපි දනිමු. උදාහරණ වශයෙන් අප අතර සිටින හැට හැවිරිදි කෙනෙකුගේ කථා බහත් දහඅට හැවිරිදි කෙනෙකුගේ කථා බහත් සංසන්දනය කළහොත් මේ කරුණ අපට පැහැදිලි වනු ඇත.

i. වාචික භාෂාව. ii. අභිනය භාෂාව iii. සළකුණු භාෂාව යන මාධ්‍ය තුනේදීම අනුගමනය කරන්නේ එකම ක්‍රියා වලියකි. මෙහිදී මෙම භාෂා මාධ්‍ය මගින් කරනු ලබන සංනිවේදනය එම මොහොතට පමණක් සීමා වන්නේය. එය අනාගතයට තබා ගත නොහැක. එමෙන්ම ඒවා නැවත නැවත අවශ්‍ය වුවහොත් ඉදිරිපත් කළ යුතුය. විශේෂයෙන්ම කතා ව්‍යවහාරයේදී මෙම ලක්ෂණය දැකිය හැක. වචනයක් පිටකර මොහොතකින් එය නැති වී යයි. එපමණක් නොව මෙම මාධ්‍යයේදී යමක් ඉදිරිපත් කළ හැක්කේ ඉතා ඉක්මණින් බව පෙනේ. එනම් මෙහිදී කාලය සහ අවකාශය පිළිබඳ ප්‍රශ්නයක් ද පැන නැගෙයි. එහෙත් ලේඛන මාධ්‍යයේදී එවැනි ප්‍රශ්න කිසිවක් පැන නොනගියි. එහෙයින් යමක් අනාගතයට ප්‍රයෝජනවත් වන පරිදි ලියා තබා ගැනීම ජනසංනිවේදනයේ පහසුම මෙන්ම හොඳම මාධ්‍ය බව පෙනේ. එසේ නොවූයේ නම් අතීත තොරතුරු පිළිබඳව කිසිවක් අපට අනාවරණය නොවන්නට ඉඩ තිබුණි. මනුෂ්‍යයා ප්‍රාකෘතික තත්වයෙන් මිදෙමින් ශිෂ්ඨාචාරයක් ගොඩ නැංවීම අරඹද්දී සිය අදහස් උදහස් ස්ථාවරව නිරූපනය කරන ක්‍රමයක් ඔහුට අවශ්‍ය වූ බව පෙනේ. අදහස් උදහස් කථා මාධ්‍යයෙන් ඉදිරිපත් කළ විට ඒවා එම ක්‍රියාව සිදුවන ස්ථානයට පමණක් සීමා වෙයි. එසේම එම අදහස් ප්‍රකාශ කල අවස්ථාවේ දී පමණක් පැවැතී නැසී යයි.

ශිෂ්ඨාචාරය ගොඩනැංවීමේ දී අදහස් ප්‍රකාශන මාධ්‍යයේ ඇති මේ සීමාවන් ජය ගත යුතුවේ. යම් යම් අදහස් පසු කාලයේ ප්‍රයෝජනය සඳහා ස්ථාවරව තැන්පත් කළ යුතුය.

එසේම ඇතැම් අදහස් දුර බැහැර ස්ථානයන්හි වෙසෙන්නන් ගේ දැනුම සඳහා පතුරුවා හැරිය යුතු ද වේ. මේ අවශ්‍යතා කථා මාධ්‍ය පමණක් පැවැතුනු යුගයේදී ඉටු කර ගන්නා ලද්දේ ඉතා අසීරුවෙනි. අමතක නොකොට පවත්වා ගත යුතු වූ අදහස් කට පාඩමින් පරම්පරාවෙන් පරම්පරාවට පවත්වා ගෙන එන ලද්දේය. ඈත ස්ථාන කරා පණිවුඩ කරුවන් අත අදහස් පතුරුවා හරින ලදී. එහෙත් ක්‍රම ක්‍රමයෙන් මනුෂ්‍යයාගේ ඥාන සම්භාරය ස්වභාවයෙන් සංකීර්ණ වීමත් ප්‍රමාණයෙන් පුළුල් වීමත් නිසා ඉහත කී අන්දමට වඩා කාර්‍යක්ෂමව එම අවශ්‍යතා ඉටු කර ගැනීමේ මාධ්‍යයක් වශයෙන් ලේඛන මාධ්‍ය නිපදවා ගන්නා ලදි. මේ අනුව වර්තමානයේ පවතින ලිපි හුවමාරුව වැනි මාධ්‍යයන්ට ලේඛන ක්‍රමය නිසා පහසුය. ආදි මිනිසාට ද තම අවශ්‍යතාවන් දුර බැහැර පුද්ගලයන් සමඟ ඉටු කර ගැනීමට අවශ්‍ය විය. එහෙයින් ඔහු ලේඛන මාධ්‍ය ඒ සඳහා නිපදවා ගත්තේ ය.

ජන සංනිවේදන මාධ්‍යයක් වශයෙන් කථා ව්‍යවහාරයේදී යමක් පැවැසිය හැක්කේ තමන් ඉදිරිපිට සිටින සීමිත කොටසකට පමණි. එහෙත් ලේඛන මාධ්‍ය මගින් විශාල ජනතාවකට ස්වකීය පණිවිඩය පතුරුවා හැරීම පහසුය. උදාහරණයක් වශයෙන් වර්තමානයේ පවතින පුවත්පත්, සඟරා, පොත් සහ වෙනත් ලේඛන මගින් ලෝකයේ එක් කොණක සිදුවන යමක් ඉතා කෙටි කලක් තුළදී ලෝකවාසී ජනතාවට ලබාදිය හැක. මෙවැනි අවශ්‍යතාවන් සපුරා ගැනීමේ පරමාර්ථය නිසා ලේඛන මාධ්‍ය බිහි වන්නට ඇතැයි සිතේ.

බොහෝ විද්වතුන් දිනෙන් දින සොයා ගන්නා ඥාන සම්භාරය පුස්තකාල වැනි ලේඛනාගාරවල තැන්පත් කර තැබීමටත් එයින් වර්තමානයේ සහ අනාගතයේදී ප්‍රයෝජන ගත හැකිවීමටත් හැකිව තිබෙන්නේ ලේඛන මාධ්‍යයේ මහිමය නිසාය. එබැවින් එවැනි අවශ්‍යතාවයන් අතීත මිනිසාට ද නොතිබුණා විය නොහැක.


1. A Short History of Linguistic-R. H. Robinson
2. Language-Edward Safier
3. Writting-David Diringer
4. භාෂාව හා සමාජය - කේ. එන්. ඕ. ධර්මදාස
5. චතුෂ්ෂෂ්ටි කලා - ඩී. ආර්. සෙනෙවිරත්න


© ඒ ලගමුව 1992

# NATIONAL LIBRARY OF SRI LANKA COMPLETES TWO YEARS

**UPALI AMARASIRI**

**Director**
**National Library of Sri Lanka**

( Inaugural Address by Mr. Upali Amarasiri, Director, National Library of Sri Lanka at the Sri Lanka Library Association Seminar on " **The Better Librarian Communicates** " on 25.07.1992 at the National Library Auditorium)

It is with great pleasure that I accepted the invitation from the SLLA to deliver the inaugural address at this important seminar. My congratulations go out to the Library Association for organising this valuable and timely exercise with the objective of improving the knowledge of professionals, para professionals in the field and Library Science students. The Sri Lanka Library Association, as all of us are aware is the backbone of our profession. During its 32 year existence it has served the Library community and the country at large in no small way.

I am also happy to say that the SLNLSB and the SLLA have always been maintaining a cordial and friendly relationship. This relationship was further strengthened last year during the tenure of Mr. Kamaldeen's presidency. The present President Mr. Lankage has wasted no time in consolidating this position. He is serving on a number of committees of the Board at present and we have a very useful relationship, which helps to complement each others work.

With these ideas in mind I thought of enlightening you of the recent developments in the National Library of Sri Lanka, briefly in my inaugural address.

The National Library is one of the important cultural institutions all of us misssed in Sri Lanka during the last few decades. Specially when all our neighbours - India, Pakistan, Bangladesh, Singapore, Thailand - established their own National Libraries decades ago, we had to face a rather embrassing position of not having a National Library, inspite of achieving a high status in cultural and literacy areas.

This is why we rejoiced when finally the National Library of Sri Lanka was inaugurated in 1990. There is no doubt that the inauguration of the National Library was an important land mark of the library development in Sri Lanka.

What are the challenges we face with this new institution? What are our achievements during the last two year period? What are the future plans? I like to share some of my thoughts with you very briefly on the above areas.

Construction of the Library building may be a good point to start. As you may be aware it took 12 long years to complete this building. UNESCO provided the planning and consultancy services for the construction works while our government financed the project.

It was a very frustrating experience for all of us to see the building work progress at a snail'space. The UNESCO Consultant who paid a number of visits to Sri Lanka was instrumental in what ever progress that was made of the building at that time. It still rings in my ears how he shouted, threatened, persuaded and begged the contractor and other relevant officials at the co-ordinating meetings. As usual there were numerous excuses made by the contractor and other officials for the slow progress. The National Library Services Board was virtually helpless as the construction work was given to the Buildings Department who had sub-contracted it to a private contractor.

As a result of the long delay, the original estimates of the building had to be revised several times and it ended up as a five fold increase of the original cost. We had to go to the Cabinet with revised estimates several times. These affairs took time and a lot of energy. Eventually His Excellency the present President then the Prime Minister had to intervene to finalise the matter. I am mentioning these facts to give you some idea about the initial difficulties we faced. There are numerous incidents which come to my mind associated with this rather gloomy period, but this is not the forum to go in to these details.

One of the most important requirements at this early stage was the identification of activities and responsibilities of the new National Library. As we all are aware there is scant mention about the functions of the National Library in the present Act. The Act merely states that "Establishment and maintenance of the National Library" is a function of the SLNLSB. There were a few early attempts to identify the National Library activities. At the senior staff meeting of the SLNLSB held in May 1989, the functions of the new National Library were identified. These were further discussed and developed at the seminars held at the SLNLSB prior to the inauguration of the National Library in April 1990, and later published in the National Library Commemorative volume. The functions of the National Library have been identified after taking into consideration all previous studies on the subject by both local and foreign experts and special local circumstances.

Staffing the National Library was a major problem. This had two phases. The first phase was the procuring and creating of new posts. This was a difficult task as the government is determined to prune down the size of the public sector. No new posts were approved unless we were able to prove that they were essential. At the culminatin of arduous negotiations with the officials of the Ministry of Public Administration and Treasury, we were finally able to obtain approvel for a good number of new posts.

The next phase of the problem occured when filling the new posts and the existing vacancies in the cardre. This is due to an anomaly in the salaries of the SLNLSB and the Universities where qualifications required are identical. Up-to 1990 there was no such anomaly. Subsequently salaries of the universities were increased while SLNLSB salaries remain unchanged. This has led to the problem of filling vacancies and retaining trained staff at the National Library. Presently there is a move by the Ministry of Education and Higher Education to solve this problem by equating once again the salaries of the SLNLSB to those of the Universities. No doubt the dearth of qualified persons in the library field aggravate this situtaion further.

Another related problem at present is staff training. As most of the professional posts at the higher levels are vacant, there is a high pressure on the mid level professional staff. There is an urgent need to provide them with the minimum training required, in order to enable them to perform their duties satisfactorily.

With this background in mind I would like to spell out very briefly some of the achievements of the National Library during the past two year period.

The **National Bibliography** has been improved tremendously during the last 2 years. Until 1990 compilation was dependent exclusively on the deposit copies received from the National Archives. From 1990, in addition to the deposit copies, material acquired from the following sources in the National Library itself are made use of in the compiltation of the National Bibliography.

- National Library Acquisitions
- ISBN deposit copies
- Author Publisher Project deposit copies
- Publication Assistance Project deposit copies

These additional sources have improved the quality of the National Bibliography which is now more complete and exhaustive. The National Bibliography is further improved by the introduction of the **CIP Section** which covers forthcoming publications

Commencing the preparation of the **Retrospective Bibliography** is another achievement of this period. So far the National Bibliography covered the period of 1963 - 1990. In 1991 the National Library commenced the Retrospective Bibliography Project to cover the period between 1885 - 1962. Already one volume of this has been completed and plans are under way to complete the project whithin five years.

Computerisation of the National Bibliography has been given much thought. Organising a bibliographical net work at national level is also under consideration.

The **Documentation Centre** is a new addition to the institution and engages in a number of documentation activities. During the last two year period it has produced some impressive bibliographies and Directories. These include;

- Sri Lanka Conference Index - 1990
- Directory of Social Science Libraries & Documentation Centres
- Selected bibliography on SAARC
- Directory of Social Scientists in Sri Lanka
- Index to "Library News"
- Bibliographies on children's literature in Sri Lanka
- Directory of libraries in Sri Lanka

The **Referrel Centre** and the **Union Catalogue** are also a part of the Documentation Centre. At present about 12 major libraries in the country contribute to the Union Catalogue Project. The role of the Referrel Centre too is similar to that of the Union Catalogue. It directs the readers to the resources of other major libraries. Presently information on the resources of a number of main libraries in the country is available in the National Library.

We had started **collection building** prior to the inauguration of the National Library. The Revision of the Printers and Publishers Act in 1976, made the SLNLSB one of the deposit libraries in the country. Thus deposit copies coming under the Legal Deposit Law is one of the main sources of collection building at the National Library. As you may be aware our legal deposit legislation is not the best in the world. It has many shortcomings which include inadequate coverage, difficulties of implementation and delays. These shortcomings naturally affect collection building at the National Library too. The National Library has its own resources for collection building purposes with an annual allocation of about Rs. 2.5 million.

Resulting from our close association with writers, publishers and printers in the country we receive new Sri Lankan publications without much difficulty. Actually this has proved to be a more reliable, quick and comprehensive source for collection building than the deposit channel.

In 1987 we received directions from the government, that the National Library should develop a comprehensive **Science reference collection** as a part of the National Library. Under this we have been collecting reference material in S & T area in consultation with other libraries.

As a relatively new National Library we have to be very cautious in collection development activities. One important point to keep in mind is that there are a number of 'de facto' National Libraries in the country. Libraries such as the National Museum, National Archives, Royal Asiatic Society, Peradeniya University, Archaeological Department and the Colombo Public Library have vast collections. The Sri Lankan Collections of these libraries are very comprehensive and the material has been collected, painstakingly during the last 100 years or so. The National Library will not try to collect material already avaiable in these libraries, unless they are

essential to the National Library. We recognise the unique value of these collections and consider them as part of the national collection. They can remain with the presnt authorities and the National Library will maintain a bibliographical data base on these collections. As far as science material is concerned, we recognise the role of NARESA and other leading scientific libraries and documentation centres in the field and collect the material in consultation with these institutions.

As you are aware, one important difference between the National Library and the other types of libraries is that the National Library has a wider national role to play unlike institution bound services. Therefore the National Library is also engaged in a number of major library development projects at national level. In the short time allocated for this address, it is difficult to spell out all such projects, and I will therefore mention only the major projects.

The **Pradeshiya Sabha Library Development Project** aims at the development of library Services at grass root level in the country. The National Library has set up Pradeshiya Sabha Library committees through out the country and these committees oversee the development of library services in their respective areas. This is the first time in Sri Lanka that all types of libraries in one area have come under the surveillance of one authority. Up to the present, public, school, pirivena and other types of libraries were scattered thoughout the country with no collaboration or co-operation amongst them. Now under the pressent system we encourage them to have co-operation in acquisition, cataloguing, inter library loans, resource sharing and conservation.

The **National Conservation Project** was launched in 1992 to create a national awareness of the importance of conservation of library materials. Under this project, steps have been taken to open 50 preservation centres in 50 major libraries. The National Library will provide, the basic equipments for these centres and training for selected personnel who man these centres. One centre is expected to serve at least 10 small libraries in the area. Book binding, repairing, fumigating and other conservation activities will be performed in these centres. This is the first conservation Project launched at national level. These centres are expected to train unemployed youths in the area in book binding and encourage them to commence book binding and repairing as small scale entreprenears.

The National Library has very close co-operation with publishers and writers in the country. The well known **Publication Assistance Project** helps 100 writers annually to publish 100 titles. So far about 800 new titles amounting to around 3 million copies have been published under this scheme. In addition to this scheme assistance to authors is provided by purchasing copies of all the new books published.

The ISBN Division furnishes **ISBN numbers** for all new books published in the country. This projcet has created a close rapport between the book industry and the National Library.

The National Library is synonymous with **book donations** to libraries. Annually we donate books to the value of approximately Rs. 2 Million for small and economically weak libraries. Supplying library furniture is another major project of the National Library. Library furniture is provided to newly constructed library buildings. The aim of the project is to persuade library local authorities to build new library buildings.

The National Library has formulated **Library standards** for school, public and departmental libraries with the objective of introducing minimum standards for these libraries.

The **Education Division** of the National Library conducts short courses, workshops,seminars and training courses for library personnel. The main beneficiaries are librarians of small school and public libraries in the country.

"Library News" the National Library quarterly newsletter is sent to all libraries. It has been updated and now it is more a professional journal than a newsletter.

**Book exhibitions** are yet another area that the National Library excels in. We organise about 10 major book exhibitions annually in all parts of the country. In 1991 the National Library organised the first ever international book fair to celebrate the Colombo SAARC Summit. The success of this exhibition is amply reflected from the numerous inquiries we have already received from leading publishers in the Asian region regarding the holding of another such exhibition.

**A new National Library Act** was drafted in 1992. With the National Library finally coming into existence the functions and responsibilities of the National Library should be clearly defined. This is the main reason for the need of a new act. The drafting committee which included the President of SLLA as a member, has rectified many deficiencies in the present Act and spells out functions of the National Library. Another important feature in the new draft is that the President, SLLA, Chairman NARESA & Chairman CINTEC are an ex-officio members of the Board. In addition to these new features all the useful sections of the present act have been retained in the new draft. At the moment this draft is with the Ministry of Education and Higher Education.

We are very keen to further the close co-operation between the National Library and the SLLA. I would like to take this opportunity to invite the students of SLLA who have completed the 1st year certificate exam to work in the National Library in their spare time. We need assistance in our cataloguing, documentation and indexing sections. They can be of assistance in these areas and gain valuable work experience. This will also carry monetary benifits as well. The National Library has one of the best Library & Information Science collections in the country. We invite all of you to use it for the betterment of your professional knowledge.

Finally I like to thank the organisers once again for inviting me to deliver the inaugural address on this occasion. I wish your deliberations at this seminar every success.

Thank you.

© *Upali Amarasiri*




කළුතර කටුකුරුන්දේ රෝමානු කතෝලික විදුහලෙහි පුස්තකාලයට පොත් පරිත්‍යාග කිරීම
களுத்துறை றோ. க. பாடசாலைக்கு நூல் அன்பளிப்பு
Book donation to Roman Catholic School Kalutara
1992.07.29

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පුස්තකාලය සහිත නව ගොඩනැගිලි සංකීර්ණය
இலங்கை பௌத்த, பாளி பல்கலைக் கழகப் புதிய நூலகக் கட்டிடம்
New building complex of the
Sri Lanka Buddhist and Pali University




සාහිත්‍ය මාසය වෙනුවෙන් පැවැත්වූ පොත් ප්‍රදර්ශනය
சாகித்திய மாதத்திற்கான நூற் கண் காட்சி
Book exhibition to celebrate the literary month
1992.09.25 / 29






"මත් ද්‍රව්‍ය දුරලමු - පොත් පත් කියවමු" සම්මන්ත්‍රණය
'நாடவேண்டியது நூல்கள், தவிர்க்க வேண்டியது போதைவஸ்து' என்ற பொருளில் கருத்தரங்கு
Seminar on "No to drugs, Yes to books"
1992.09.25 / 29




ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් කොළඹ 13. යුනයිටඩ් මර්චන්ට් ආයතනයේ මුද්‍රණය කරවා පළකර

## National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/10
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ......

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ......

Date : 2017/10/10

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*